වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
Annual Performance Report

2022



ජනමාධ්‍ය අමාත්‍යාංශය
வெகுசன ஊடக அமைச்சு
Ministry of Mass Media

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2022

ජනමාධ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය : 105

2020.01.30 දින රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ආකෘති පත්‍රය ප්‍රකාරව මෙම වාර්තාව සකස් කොට ඇත.

අන්තර්ගතය

			පිටුව
පරිච්ඡේදය 01	-	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01 - 10
පරිච්ඡේදය 02	-	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	11 - 30
පරිච්ඡේදය 03	-	වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	31 - 38
පරිච්ඡේදය 04	-	කාර්ය සාධන දර්ශක	39 - 42
පරිච්ඡේදය 05	-	තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	43 - 48
පරිච්ඡේදය 06	-	මානව සම්පත් පැතිකඩ	49 - 54
පරිච්ඡේදය 07	-	අනුකූලතා වාර්තාව	55 - 63

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන / අරමුදල්

අ) ව්‍යාපෘතිය

ආ) දායක නියෝජිතායතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම

ඈ) ව්‍යාපෘති කාල සීමාව

1.0 ජනමාධ්‍ය අමාත්‍යාංශය

1.1 හැඳින්වීම

ජනමාධ්‍ය, සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් පමණක් නොව සමාජීය පාලන සාධකයක් හා ව්‍යාපාරික ආයෝජන ක්ෂේත්‍රයක් ලෙස ද සමාජය පුරා ප්‍රබලව ක්‍රියාත්මක වේ. ජනමාධ්‍ය පුද්ගලයාට හා සමාජයට සිදුකරන බලපෑම අභිබවා දේශපාලන, සංස්කෘතික හා ආර්ථික අංශ කෙරෙහි ද ආධිපත්‍ය පැතිරවීමට සමත්ව ඇත. සන්නිවේදන මාධ්‍යයන්ගේ හා තොරතුරු තාක්ෂණයේ වේගවත් වර්ධනය හේතුවෙන් වත්මන් ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වය පුද්ගල ජීවිතයට හා ජන සමාජයට එල්ල කරන බලපෑම් සුළුපටු නොවේ. ආර්ථික වශයෙන් දියුණු ශ්‍රී ලංකාවක් ගොඩනැගීමෙහිලා ක්‍රියාත්මක සංවර්ධන වැඩපිළිවෙල වඩාත් සුහදායී දිශානතියකට යොමු කිරීමට අමාත්‍යාංශය සතු ප්‍රබල ශක්‍යතාවන් නිසි පරිදි යොදා ගැනීම ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අපේක්ෂාව වේ.

යහපත් මාධ්‍ය සංස්කෘතියක් ශ්‍රී ලාංකේය මාධ්‍ය ක්ෂේත්‍රය තුල ගොඩනැගීම යථාර්තයක් බවට පත් කරනු වස් ඉහළ වෘත්තීය නිපුනතා සහිත මාධ්‍ය වෘත්තිකයන් බිහිකිරීම තුලින් සදාචාරාත්මක ස්වයං පාලනයක් සහිත මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීමට අවශ්‍ය මාධ්‍යවේදීන් බිහිකිරීම ද අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණකි.

මාධ්‍යවේදීන්ට තම මාධ්‍යකරණ කාර්යය මනාව ඉටු කිරීම සඳහා සුරක්ෂිතභාවයක් හා විශ්වසනීයභාවයක් පවත්වා ගැනීමට මෙම අමාත්‍යාංශය විසින් ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා මූල්‍යාධාර සැපයීම හා සුබසාධනය සඳහා අවධානය යොමු කර ඇත.

ජනමාධ්‍ය හා සන්නිවේදන ක්ෂේත්‍රයේ ගෝලීය වර්ධනය සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ මාධ්‍ය ප්‍රමිතිකරණය සඳහා පවතින අණපනත්, අන්තර්ජාතික මාධ්‍ය ආයතනවල ක්‍රියාකාරිත්වය සහ සමාජ, සංස්කෘතික අනන්‍යතා ක්ෂේත්‍රයන්ට විශේෂ අවධානය යොමු කරමින් ශ්‍රී ලාංකීය ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇති අතර මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක අවශ්‍යතාවයද මෙම අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇත.

ජන මනසට ඉමහත් බලපෑමක් සිදුකරනු ලබන සමාජ මාධ්‍යයේ සෘණාත්මක හැසිරීම සම්බන්ධයෙන් වර්තමානයේ සමාජ කතිකාවතක් නිර්මාණය වී තිබේ. මෙම බලපෑම හේතුවෙන් සමාජ මාධ්‍ය පාලනයක් නොව, නියාමනයක අවශ්‍යතාවය මෙම අමාත්‍යාංශය වටහාගෙන ඇත.

කාලීන අවශ්‍යතාවයන්ට අනුගත වෙමින් මෙම අමාත්‍යාංශයීය විෂය පථය යටතේ ඇති ආයතනවලට අදාළ යල්පැනගිය අණපනත් සංශෝධනය කිරීම ආරම්භ කර ඇත. අදාල නීති වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම තුලින් එම ආයතන මාධ්‍ය ක්ෂේත්‍රයේ පවත්නා දැඩි තරඟකාරීත්වයට සාර්ථකව මුහුණදීමට හැකි වන පරිදි ශක්තිමත්වනු ඇත.

දශක හතරක රූපවාහිනී ගමන් මගේ අන්තර්ජාතික හැරවුම් ප්‍රවේශයක් ලෙස මෙරට ඇනලොග් රූපවාහිනී විකාශන පද්ධතිය පූර්ණ ඩිජිටල්කරණයට ලක් කිරීමේ ව්‍යාපෘතිය (Digital Terrestrial

Television Broadcasting - DTTB Project) මගින් ශ්‍රී ලාංකේය රූපවාහිනී නැරඹීමේ කලාව විශාල පරිවර්තනයකට ලක් වනු ඇත.

ප්‍රවෘත්ති වෙබ් අඩවි ලියාපදිංචි කිරීම සහ ආනයනය කරන ලද ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් සඳහා බදු අයකිරීම මගින් මෙම අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරයට ආදායම් උපයා දෙනු ලැබේ.

මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනය රැඳී ඇත්තේ සාම්ප්‍රදායික මාධ්‍ය කලාවෙන් ඔබ්බට විහිදුනු තොරතුරු මත පදනම් වූ නව මාධ්‍ය ගමනකිනි. සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය භාවිතය පිළිබඳ දැනුම, අවබෝධය සහ සන්නිවේදන උපක්‍රම සමාජගත කිරීම සහ ඩිජිටල් තාක්ෂණයට අනුගතවීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම කෙරෙහි මේ වන විට අවධානය යොමු වී තිබේ. මෙම කර්තව්‍ය සාර්ථක කරගැනීම සඳහා අමාත්‍යාංශයේ අංශයක් වන ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය යොදා ගැනේ.

පුරවැසියාට තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම වර්තමානයේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුල ක්‍රියාත්මකවන සෑම රටකටම ඇති ප්‍රධානතම වගකීමකි. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ද තම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

ජනමාධ්‍ය අමාත්‍යාංශයීය විෂය පථය යටතේ ඇති ආයතනවල ප්‍රගති සමාලෝචනය අඛණ්ඩව සිදු කර ඇති අතර රාජ්‍ය මාධ්‍ය ආයතන නිසි මූල්‍ය ශක්‍යතාවයකින් පවත්වාගෙන යාම සඳහා අමාත්‍යාංශය දැඩි ප්‍රයත්නයක් දරමින් සිටී.

රාජ්‍ය මාධ්‍ය හැසිරවීමේදී තොරතුරුවල සමබරතාවය ආරක්ෂා කරමින් අගති විරහිත වන පරිදි ක්‍රියාත්මක වීමට අමාත්‍යාංශය කටයුතු කර ඇත.

හොඳින් දනුම්වත්වූ, බහුමතික සහ සක්‍රිය සමාජයක් ගොඩනැගීම සඳහා නිදහස් මාධ්‍ය සම්ප්‍රදාය ප්‍රවර්ධනය කිරීම, මාධ්‍ය කර්මාන්තයේ දියුණුව සඳහා අවශ්‍ය මැදිහත්වීම සිදුකිරීම මෙන්ම දේශීය ජනවිඥානය ප්‍රගතිය කරා මෙහෙයවිය හැකි වගකීම් සහගත මාධ්‍ය භාවිතයක් සඳහා මාධ්‍ය කර්මාන්තය ධෛර්යමත් කිරීම සඳහා අවශ්‍ය දායකත්වය ජනමාධ්‍ය අමාත්‍යාංශය නිරතුරුවම ලබා දෙනු ඇත.

1.2 අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර, පරමාර්ථ

දැක්ම

"මනාව දැනුම්වත් වූ, බහුමතික සහ සක්‍රීය සමාජයක්"

මෙහෙවර

"ජනහිතකාමී වූ, සංවර්ධනයට දිශානත වූ, නිදහස් සහ වගකීම් සහිත ශ්‍රී ලාංකේය ජනමාධ්‍ය කලාවක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීම, පහසුකම් සැලසීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසු විපරම"

පරමාර්ථ

- වඩා යහපත් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැංවීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම.
- මහජනතාවට තොරතුරු වෙත ප්‍රවේශවීමේ සමාන අවස්ථාවන් පුළුල් කිරීම.
- නවීනතම තාක්ෂණය සමඟ මාධ්‍ය ක්ෂේත්‍රය වෙත පහසුකම් සැලසීම.
- මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම උදෙසා දිරිගැන්වීම.
- ජාතික සංවර්ධන ප්‍රයත්නයේදී මාධ්‍ය දායකත්වය සහ සහභාගීත්වය ඉහළ නැංවීම.
- ජාත්‍යන්තර වශයෙන් රටෙහි ප්‍රතිරූපය ඔප්නැංවීම උදෙසා නායකත්වය සැපයීම.
- අමාත්‍යාංශයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මානව සම්පත සංවර්ධනය කිරීම.
- අමාත්‍යාංශය වෙත අනුබද්ධිත වූ ආයතනයන්හි සම්පත් සාර්ථකව ප්‍රයෝජනයට ගැනීම.
- අදාල පාර්ශවයන් සම්බන්ධීකරණය කිරීම තුලින් සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

1.3 අමාත්‍යාංශයේ විෂයපථය, කාර්යයන්, කර්තව්‍යයන් හා සුවිශේෂී ප්‍රමුඛතා

1.3.1 විෂය පථය

භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ඇතුළුව නිවැරදි තොරතුරු දැනගැනීමේ ජනතා අයිතිය තහවුරු කරන තොරතුරු දැනුම හා මතවාදයන් සමබර සන්නිවේදනයක් සඳහා උචිත ජනමාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම මෙන්ම රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "විනිවිදභාවයෙන් යුතු ජනමාධ්‍ය සංස්කෘතියක් හඳුන්වාදීම" සඳහා නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව ජනමාධ්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

1.3.2 2022.07.22 දිනැති අංක 2289/43 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්

- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ජනමාධ්‍ය විෂයයට සහ අදාල දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- ජනතාවගේ නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- රජයේ මුද්‍රණ හා ප්‍රකාශන කටයුතු
- ජනතාවගේ දැනුම ආකල්ප හා රසඥතාවය දියුණු කරමින් ආර්ථික, සාමාජීය, සංස්කෘතික දියුණුව සඳහා ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායයන් සම්පාදනය.
- මාධ්‍ය භාවිතය සඳහා නවීන තාක්ෂණය යොදාගැනීම වර්ධනය කිරීම.
- ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වාදීම.
- රාජ්‍ය නිල නිවේදන හා ප්‍රවෘත්ති පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- ශ්‍රී ලංකාව පිළිබඳ අදාළ තොරතුරු දේශීය හා විදේශීය ජනමාධ්‍ය ආයතනවලට නිකුත් කිරීම.
- විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක සේවා සැපයීම.
- ප්‍රවෘත්ති, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම පිණිස උචිත ක්‍රියාමාර්ග ගැනීම.
- වාණිජ රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාර සහ විදේශ විකාශයන් ඇතුළු ප්‍රචාරක කටයුතු
- නවතම තාක්ෂණය සහ කළමනාකරණ ක්‍රමවේදයන් භාවිත කරමින් විවිධත්වය තුලින් ව්‍යාපාර අරමුණු කර ගත් නවීන තැපැල් සේවයක් ලබාදීම සහ දේශීය හා විදේශීය තැපැල් සේවා කටයුතු කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම.
- ලංකා මුද්දර කාර්යාංශය පරිපාලනය කිරීම.

1.3.3 සුවිශේෂී ප්‍රමුඛතා

- විනිවිදභාවයෙන් යුත් ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.
- ජාතික හා ජාත්‍යන්තර නීති රෙගුලාසිවලට අනුගත වන පරිදි මාධ්‍ය ප්‍රමිතීන් ස්ථාපිත කිරීම.
- ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන සඳහා සමාජ සංස්කෘතික වටිනාකම් සහ සමාජ සාරධර්ම පිළිබඳ රාමුව ඉක්මවා නොයන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම.
- මාධ්‍යවේදීන්ට පහසුකම් සැපයීම සඳහා පළාත් මට්ටමෙන් කටයුතු සිදුකිරීම.
- ශ්‍රී ලංකා තැපැල් සේවය ජනතා අවශ්‍යතා සඳහා පුළුල් කිරීම.
- සමාජ මාධ්‍ය ඇතුලු නව මාධ්‍ය භාවිතය සහ හැසිරවීම පිළිබඳ වෘත්තීමය දැනුම හා අවබෝධය ලබාදීම සඳහා සමාජ අධ්‍යාපන ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ජනමාධ්‍ය උසස් අධ්‍යාපන වෘත්තීමය කුසලතා ප්‍රවර්ධන අවස්ථාවන් ඇති කිරීම.
- නව තාක්ෂණය පදනම්ව කාර්යක්ෂම හා නව අවස්ථාවන්ට ඉලක්කගත වූ ජනතා කේන්ද්‍රීය ඩිජිටල් තැපැල් හා ආශ්‍රිත සේවාවන් සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.

1.4 සංවිධාන සටහන



අනෙකුත් තනතුරු :	අනුමත		අනුමත
ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහකාර/ සංවර්ධන නිලධාරී	44	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) සහකාර	05
විමර්ශන නිලධාරී (විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය)	11	තාක්ෂණ සහායක	01
කළමනාකරණ සේවා නිලධාරී	27	රියදුරු	18
පිළිගැනීමේ නිලධාරී	01	කාර්යාල කාර්ය සහායක	20
අනුමත සේවක සංඛ්‍යාව - 158			
තත්‍ය සේවක සංඛ්‍යාව - 120			
මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව – 2020.09.04, 2020.09.18 සහ 2020.11.27 දිනැති ලිපි ප්‍රකාරව			

1.5 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

i) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ii) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

iii) ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව

1.6 අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

i) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

ii) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

iii) සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

iv) සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

v) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

vi) සැලසිනෙ රූපවාහිනී ආයතනය

vii) සී/ස ලංකා පුවත් ආයතනය

viii) ශ්‍රී ලංකා පදනම් ආයතනය

ix) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

x) ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

xi) ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය

xii) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

1.7 විදේශ මූල්‍යනය මත දිවෙන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

අ) ව්‍යාපෘතියේ නම : ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය

ආ) ආධාර ලබා දෙන ආයතනය : ජපාන රජය (JICA)

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : ජපන් යෙන් මිලියන 17,717

(JICA ආයතනයේ දායකත්වයේ වටිනාකම ජපන් යෙන් මිලියන 13,717 ක්ද රජයේ

දායකත්වය ජපන් යෙන් මිලියන 3,505 ක්ද වශයෙනි.)

ඈ) ව්‍යාපෘති කාලය : 2021 - 2028

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ජයග්‍රහණ

ප්‍රගතිය හා ඉදිරි දැක්ම - 2022 වසරේ අත්කරගත් ප්‍රගතිය

2.1.1 "ඇසිදිසි පෙරමග" සංවර්ධන පුවත් ජනගත කිරීමේ ඒකාබද්ධ ප්‍රචාරක වැඩසටහන

රජයේ අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින ආයතන විසින් රටේ සංවර්ධනයත්, ජනතා සුබසාධනයත් වෙනුවෙන් ඉටුකරනු ලබන හා ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන් පිළිබඳව මාධ්‍ය මඟින් පුළුල් ප්‍රචාරයක් ලබාදීම හරහා මහජනතාව දැනුම්වත් කිරීම සඳහා "ඇසිදිසි පෙරමග" නමින් ප්‍රචාරක වැඩසටහනක් ජනමාධ්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, රාජ්‍ය විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය හා ලේක්හවුස් ආයතනයද ප්‍රමුඛ කොටගෙන ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය සහ සැලසිනෙ ආයතනයේ ඒකාබද්ධ දායකත්වයෙන් මෙම වැඩසටහන දියත් වේ.

වත්මන් ජනමාධ්‍ය භාවිතය තුළ විවිධ අවස්ථාවන්වලදී ජන සමාජයේ ප්‍රගමනයට බාධාවන අයුරින් ජනතාව වෙත තොරතුරු මුදාහැරීම සිදුකරන බැවින් එම තත්ත්වය මඟ හැරවීම සඳහා නිවැරදි සංවර්ධන තොරතුරු ජනතාව වෙත ලබාදීමත්, ඒ සඳහා සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයේම සහාය ලබාගැනීමත් මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය අමාත්‍යාංශ 9 ක ලේකම්වරුන්, ආයතන ප්‍රධානීන් හා අදාළ නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් රාජ්‍ය මාධ්‍ය ආයතන ප්‍රධානීන් හා මාධ්‍යවේදීන් සමඟ zoom සාකච්ඡා පවත්වා ඇත.

මෙමඟින් අමාත්‍යාංශ විසින් සිදුකරනු ලබන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව පුළුල් ප්‍රචාරයක් ලබාදීමත්, අවශ්‍ය ප්‍රචාරක ව්‍යාපෘති සැකසීමත් අදාළ අමාත්‍යාංශ සම්බන්ධයෙන් සිදුවී ඇති ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් පසුවිපරම් වාර්තා සැකසීමක් ද සිදුකර ඇත.

තවද, සාකච්ඡාවට සහභාගි වූ සියලුම අමාත්‍යාංශ වෙනුවෙන් WhatsApp සමූහයක් සකසා අදාළ අමාත්‍යාංශයේ හා ඊට අනුබද්ධ ආයතනවල සංවර්ධන තොරතුරු හුවමාරු කරගනිමින් නොකඩවා ප්‍රචාරක කටයුතු ඉටු කිරීම ද සිදුකරනු ලබයි.

2.1.2 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2016 අගෝස්තු මස 04 වන දින සිට බලාත්මක වූ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කර එය සමාජගත කිරීම සම්බන්ධයෙන් වන වගකීම ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇත. 2017 පෙබරවාරි මස 03 වන දින සිට මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ අතර රජයේ නිල තොරතුරු ජනතාවට දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලන මූලධර්ම මනාව ක්‍රියාවට නැංවීමත් එමගින් දූෂණයෙන් තොර යහපත් වගකීම් සහිත රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීමත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි මූලික පරමාර්ථය විය. මෙම පනත සමාජගත කිරීම උදෙසා 2017 වසරේ සිටම ජනමාධ්‍ය අමාත්‍යාංශය අඛණ්ඩව සක්‍රීය ලෙස දායක විය.

2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ ඒකකය විසින් සිදුකරන ලද කාර්යයන්

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අනුව ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම හා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව හා සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම

මෙහිදී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව සහ තොරතුරු ඉල්ලීමේ ක්‍රමවේදයට අනුව කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණය කරන ලදී. මේ වන විට වාර්ෂික වාර්තා සහ අර්ධ වාර්ෂික වාර්තා මෙන්ම ද්වීමාසික තත්ත්ව වාර්තා 30 ක් තොරතුරු කොමිසම වෙත යොමු කර ඇත.

එමෙන්ම පුරවැසියන් හෝ පොදු අධිකාරීන් විසින් කොමිෂන් සභාව වෙතින් ඉටුකල යුතු කාර්යයන් සම්බන්ධව සහ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ විවිධ ඉල්ලීම් අදාළ ආයතන වෙත යොමු කිරීමද සිදු කර ඇත. කොමිෂන් සභාවේ පවත්වා ගෙන යනු ලබන විවිධ ලේඛන දමිළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ට පරිවර්තනය කිරීමට අදාළ කටයුතු ඉටු කර ඇත. එමෙන්ම ලේඛන කළමණාකරනය සම්බන්ධව කොමිෂන් සභාව විසින් සිදුකිරීමට නියමිත ගැසට් පත්‍රය සම්බන්ධව කටයුතු කෙරෙමින් පවතී.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත හා සම්බන්ධ උපදේශන සේවා සැපයීම

2022 වර්ෂයේ පුරවැසියන්ට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් දෛනිකව විධිමත් උපදේශන සේවා සැපයීම සිදුකරන ලදී. 2022.12.31 වන විට පුද්ගලයින් 456 ක් සඳහා විධිමත් උපදේශන ලබාදී ඇත. මීට අමතරව මෙම පනත සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමට සහ පර්යේෂණ කිරීමට රුචියක් දක්වන පුරවැසියන් දැනුම්වත් කිරීමද සිදු කෙරේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නිල වෙබ් අඩවිය (www.rti.gov.lk) පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම

පුරවැසියන්ට ඵලදායී ලෙස තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත භාවිතයට ගැනීම, මෙම පනත පිළිබඳව පුරවැසියන්ගේ දැනුම්වත්භාවය වැඩිකිරීම හා තොරතුරු ඉල්ලීම් මඟින් මහජන අවශ්‍යතා සැපයීම වෙබ් අඩවිය හඳුන්වාදීමේ අරමුණු වේ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නිල පුවත් පල කිරීම සහ ඉදිරියේදී පැවැත්වෙන වැඩසටහන් සම්බන්ධයෙන් වන ප්‍රචාරණයද වෙබ් අඩවිය හරහා සිදු වේ. එමෙන්ම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සම්බන්ධයෙන් ඉතා ක්‍රියාශීලී මෙන්ම වඩාත් ඵලදායී ලෙස භාවිතා කළ හැකි අයුරින් වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සිදුවෙයි. 2022.12.31 දින දක්වා සමස්ථ පරිශීලකයින් සංඛ්‍යාව 1,87,929 ක් වේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ විද්‍යුත් තැපෑල (info@rti.gov.lk) පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම

මෙහිදී පුරවැසියා විද්‍යුත් තැපෑල මඟින් යොමු කරන ලද තොරතුරු ඉල්ලුම් පත්‍ර අදාළ ආයතන වෙත යොමු කරනු ලැබේ. එමෙන්ම පුරවැසියන්ට සහ පොදු අධිකාරීවල නිලධාරීන්ට ඇතිවන ගැටළු සඳහා පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කරන ලද විද්‍යුත් ලිපි සඳහා පිළිතුරු ලබාදීම අඛණ්ඩව සිදුකරනු ලැබේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ තොරතුරු නිලධාරී අත්පොත, පුහුණු මාර්ගෝපදේශය, අත්පත්‍රිකා බෙදාහැරීම.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අදාලව තොරතුරු නිලධාරියාගේ හා නම්කල නිලධාරියාගේ මාර්ගෝපදේශ සංග්‍රහයක් මේ වන විට අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත බෙදා හැර ඇත. මීට අමතරව තොරතුරු නිලධාරී නව සංස්කරණය සිංහල පිටපත් 3000 ක් සහ දමිළ පිටපත් 1000 ක් මුද්‍රණය කර පොදු අධිකාරීන් වෙත බෙදා හැරීමට නියමිතය. ඉන් සිංහල මාධ්‍ය පිටපත් 1000 ක් මුද්‍රණය කර ඇති අතර 2022 තොරතුරු අයිතිවාසිකම් පිළිබඳ දිනයට සමගාමීව පැවැත්වූ පුහුණු වැඩමුළුවට සමගාමීව තොරතුරු නිලධාරීන්, නම්කළ නිලධාරීන් සහ විෂය නිලධාරීන් 150 කට මෙම අත්පොත් බෙදා දී ඇත. එම ප්‍රකාශන බෙදාහැරීම තුළින් ආයතනයන්හි තොරතුරු නිලධාරින්ගේ දැනුම යාවත්කාලීන කිරීම අරමුණ වේ.

පොදු අධිකාරීන්හි නම්කල නිලධාරීන් සහ තොරතුරු නිලධාරීන් සම්බන්ධ දත්ත පාදකය යාවත්කාලීන කිරීම

පොදු අධිකාරීන්හි අලුතින් පත්කරන ලද තොරතුරු නිලධාරීන් සහ නම්කළ නිලධාරීන් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් (Data Base) වෙබ් අඩවියේ ඇතුළත් වෙන අතර දෛනිකව යාවත්කාලීන කරනු ලැබේ. 2022.12.31 දින වන විට නිලධාරීන් 4625 ගේ තොරතුරු දත්ත පාදකයට ඇතුළත් කොට ඇත.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් Facebook පිටුවක් පවත්වාගෙන යාම සහ සමාජ මාධ්‍යවල ප්‍රචාරය කිරීම.

විශේෂයෙන්ම තරුණ ප්‍රජාව ඉලක්ක කොට ගනිමින් සහ පුරවැසියන් සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන RTI Facebook පිටුව මඟින් ආකර්ෂණීය ලෙස දැනුවත් කිරීම සිදු වෙයි. 2022.01.01 දින සිට 2022.12.31 දිනට පුද්ගලයින් 141 ක් මෙම පිටුව පරිශීලනය කොට ඇති අතර සමස්ථ පරිශීලකයන් ගණන 3369 ක් වේ. එමෙන්ම තොරතුරු නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් සම්බන්ධව එදිනම Facebook පිටුවේ පළ කරනු ලැබේ. දැනට 2022 වර්ෂයේදී පමණක් වැඩසටහන් සම්බන්ධව පෝස්ට් 27 ක විස්තර යාවත්කාලීන කොට ඇත.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් තොරතුරු නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් Afriel තරුණ ජාලයේ මූල්‍යමය දායකත්වයෙන් තොරතුරු නිලධාරීන් 230 ක් සඳහා පුහුණු කිරීමේ වැඩසටහන් 05 ක් පැවැත්විනි.

දිස්ත්‍රික්කය	ස්ථානය	තොරතුරු නිලධාරීන් සංඛ්‍යාව
කළුතර	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර	37
ගාල්ල	හසාරා හෝටලය, ගාල්ල	50
රත්නපුර	සබරගමුව පළාත් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, කුරුවිට, පුස්සැල්ල	61
කෑගල්ල	සණස කැම්පස් ආයතනය, කෑගල්ල	47
පොළොන්නරුව	අග්බෝ හෝටලය, ගිරිතලේ	35
එකතුව		**230**

මෙම වැඩසටහන් සඳහා තොරතුරු නිලධාරීන්ගේ සහභාගීත්වය ඉහළ මට්ටමක පැවැති අතර තොරතුරු ලබාදීමේ දී තොරතුරු නිලධාරීන්ට ඇතිවන ගැටලු සහ ඉදිරියේදී මෙම පනත සක්‍රීය ලෙස බලාත්මක කිරීමට අවශ්‍ය යෝජනා ලබාගන්නා ලදී.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ තෙදින නේවාසික පුහුණු පැවැත්වීම

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ තෙදින නේවාසික වැඩසටහනක් 2022 මාර්තු මස 06,07,08 යන දිනවල මහනුවර, පොල්ගොල්ල, ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේදී පැවත්විණි.

එම පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ පුහුණු උපදේශකයින් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභා වැනි ආයතන නියෝජනය වන පරිදි නිලධාරීන් 30 ක් පුහුණු කරන ලදී. එම වැඩසටහන සඳහා සහභාගී වූ පුහුණු උපදේශකයින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සම්පත්දායකයින් ලෙස යොමු කිරීමට කටයුතු කරන අතර එම නිලධාරීන් විසින් මේ වන විට එම අදාල ආයතනවල පුහුණු වැඩසටහන් 30 ක් පමණ අවසන් කර ඇත. ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන Afriel තරුණ ජාලයෙන් ලබා දෙන ලද අතර එම ප්‍රතිපාදන අදාල ආයතන වෙත යොමු කර ඇත. (එක් වැඩසටහනක් සඳහා වියදම රු. 8500 කි.) 2023 වර්ෂයේදී තවත් වැඩසටහන් 70 ක් පැවැත්වීමට සැලසුම් සකස්කොට ඇති අතර දෙමළ මාධ්‍ය පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක්ද වව්නියාවේදී පැවැත්වීමට සැළසුම් කර ඇත.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අදාල පස් අවුරුදු (2023 - 2027) උපාය මාර්ග සැලැස්ම

සැලැස්ම සකස් කිරීමට අදාලව රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය අංශවල නිලධාරීන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමේ අරමුණින් වැඩසටහන් දෙකක් පවත්වන ලදී. එම වැඩසටහන් රාජ්‍ය නොවන සංවිධාන 20 ක සහ රාජ්‍ය නිලධාරීන් 19 ක සහභාගීත්වයෙන් පවත්වන ලදී.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ දිනය සැමරීම

සැප්තැම්බර් 28 දිනට යෙදෙන ජාත්‍යන්තර තොරතුරු අයිතිවාසිකම පිළිබඳ දිනය සැමරීම සඳහා වැඩසටහනක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ ඒකකය නැවත ස්ථාපනය කිරීම

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ විශේෂ ඒකකය, වඩාත් ඉඩ පහසුකම් සහිතව සංවර්ධන හා සැලසුම් අංශයට අනුයුක්තව පිහිටුවන ලදී.

2.1.3 ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල - 2022

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය සංවර්ධනය සඳහා මාධ්‍යවේදීන් සිදුකරනු ලබන මෙහෙය අතිමහත්ය. තම සමාජ වගකීම ඉටුකිරීමටත්, ජනතාවට නිවැරදි තොරතුරු දැනගැනීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීමටත් රටේ සමස්ථ ප්‍රජාව පෙළඹවීමටත්, ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා සංවර්ධන අභිලාශයන් සාක්ෂාත් කරගැනීම සඳහා දායකත්වය ලබාගැනීමටත් ඔවුහු කටයුතු කරති. මාධ්‍යවේදීන් විසින් ඉටුකරනු ලබන මෙම මෙහෙවර සහ ඔවුන්ගේ දායකත්වය අගයකිරීමත් ගුණාත්මක මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම සඳහාත් ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙලක් පැවැත්වීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි ව ඇත. ඒ අනුව 2018 වර්ෂයට අදාලව ප්‍රථම වරට 2019 වර්ෂයේ දී ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල පවත්වා ඇත. මෙම සම්මාන උළෙලේ දී ගුවන්විදුලි, රූපවාහිනී, පුවත්පත්, වෙබ් අඩවි යන ක්ෂේත්‍ර 04 සඳහා භාෂාත්‍රයෙන් සම්මාන 51 ක් පිරිනමා ඇත. නමුත් ඉන්පසුව වාර්ෂිකව ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල සංවිධානය කටයුතු සිදු කළ ද ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවීම, Covid - 19 වසංගතය හා වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ මෙම උළෙල 2020 වසරේ සිට පැවැත්වීමට නොහැකි වී ඇත.

2.1.4 රූපවාහිනී හා ගුවන්විදුලි බලපත්‍ර නිකුත් කිරීම

ශ්‍රී ලංකාව තුළ ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශන විෂයන්ට බලපාන මූලික ව්‍යවස්ථාවන් වනුයේ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත සහ 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතය. යථෝක්ත පනත්වල සඳහන් ව්‍යවස්ථා ප්‍රතිපාදන අනුව පෞද්ගලික ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශන සේවාවන් පවත්වාගෙන යාම සඳහා මෙම අමාත්‍යාංශය මඟින් බලපත්‍ර ලබා දීම ද සිදු කර ඇත.

2022 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරීව පවතින පෞද්ගලික ගුවන්විදුලි හා රූපවාහිනී බලපත්‍ර සංඛ්‍යාව හා නාලිකා සංඛ්‍යාව

බලපත්‍ර වර්ගීකරණය	පෞද්ගලික බලපත්‍රලාභී ආයතන සංඛ්‍යාව	නාලිකා සංඛ්‍යාව
ගුවන්විදුලි	18	36
භෞමික රූපවාහිනී	16	20
එකතුව	**34**	**56**

සේවා සපයන ආයතන

බලපත්‍ර වර්ගීකරණය	බලපත්‍රලාභී ආයතන සංඛ්‍යාව
කේබල් රූපවාහිනී	05
චන්ද්‍රිකා රූපවාහිනී	03
අන්තර්ජාල මත පදනම් වූ රූපවාහිනී	03
එකතුව	**11**

තවද රාජ්‍ය ගුවන්විදුලි ආයතන දෙක වන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හා සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය (ප්‍රාදේශීය සේවාවන්ද ඇතුළුව) ගුවන්විදුලි නාලිකා 15 ක් පවත්වාගෙන යනු ලබන අතර ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය යන ආයතන දෙක ඔස්සේ රූපවාහිනී සේවාවන් 05 ක් පවත්වාගෙන යනු ලැබේ. භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස උපරිමයෙන් ආරක්ෂා කරමින් වඩා යහපත් මාධ්‍යකරණයක් සඳහා දැනට නිකුත්කර ඇති ගුවන්විදුලි හා රූපවාහිනී බලපත්‍රයන්හි ඒකමතිකභාවයක් ඇතිකිරීමේ අරමුණින් පොදු ආකෘතියක් හඳුන්වාදීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවී ඇත. මේ වන විට ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් කමිටුවක් පත්කර මේ දක්වා නිකුත් කර ඇති ගුවන්විදුලි හා රූපවාහිනී බලපත්‍ර සමාලෝචනය සිදුකරනු ලබයි. 2023 වසරේ සිට බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් වාර්ෂික පදනමින් හඳුන්වාදීමට යෝජිතය.

2.1.5 රාජ්‍ය අනුග්‍රහය සහිතව ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම

ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ සේවයේ නියුතු මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය - Chartered Institute of Media Professionals of Sri Lanka යන මැයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට සමාන්තර ස්වාධීන ආයතනයක් මහා බ්‍රිතාන්‍යයේ දැනට ස්ථාපිත වරලත් ජනමාධ්‍ය ආයතනය පදනම් කරගනිමින් රාජ්‍ය අනුග්‍රහය සහිතව ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. මේ වන විට මෙම ආයතනය ස්ථාපිත කිරීම සඳහා වන පනත් කෙටුම්පත අවසන් කර ඇති අතර අවශ්‍ය අනුමැතීන් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පසුව නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. මෙම ආයතනය තුලින් ජනමාධ්‍යවේදීන් සඳහා වරලත්භාවය පිරිනැමීමට අපේක්ෂිත අතර ඒ සඳහා වන ක්‍රමවේදය ඉහත පනත් කෙටුම්පත තුළ අන්තර්ගත කර ඇත.

හුදෙක් තවත් එක් වෘත්තීය උසස් අධ්‍යාපන ආයතනයක් බවට පත් නොවී දැනුමෙන් හැකියාවෙන් පරිපූර්ණ දක්ෂ මාධ්‍යවේදීන් හා මාධ්‍ය වෘත්තිකයන් දැයට දායාද කිරීමට මෙම ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයෙන් අපේක්ෂා කෙරේ.

2.1.6 ඇසිදිසි ජනමාධ්‍යවේදී රක්ෂණ යෝජනා ක්‍රමය

වගකීම් සහගතව සහ මාධ්‍ය සදාචාරයට අනුගත වෙමින් ජනතාව වෙත නිවැරදි තොරතුරු සම්ප්‍රේෂණය කිරීමෙහිලා මාධ්‍යවේදීහු සුවිශාල කාර්යභාරයක් ඉටු කරති. දේශපාලනික මූල්‍ය හා හදිසි අවස්ථා අවදානම් දරාගනිමින් කාලීන පුවත්, සංවර්ධන පුවත්, ප්‍රාදේශීය පුවත් වාර්තාකරණයේ නියැලෙන මාධ්‍යවේදීන් සඳහා ප්‍රමාණවත් රක්ෂණාවරණ ක්‍රමයක් නොමැත. සමහර මාධ්‍ය ආයතන විසින් මාධ්‍යවේදීන් සඳහා රක්ෂණාවරණය පිරිනමා තිබුණද, බොහෝ ආයතන ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සහ නිදහස් මාධ්‍යවේදීන් සඳහා එම අවස්ථා ලබා දී නොතිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ ජාතික අයවැයෙන් වෙන්වූ රුපියල් මිලියන 100 ක ප්‍රතිපාදන යොදා ගනිමින් මාධ්‍යවේදීන් 3,844 ක් සඳහා ඇසිදිසි රක්ෂණාවරණයක් පිරිනැමීමට ජනමාධ්‍ය අමාත්‍යාංශය කටයුතු කර ඇත. මෙම රක්ෂණාවරණ 2022.12.31 දින දක්වා වලංගු විය. රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය නේවාසික ප්‍රතිකාර ආවරණය, හදිසි අනතුරු ප්‍රතිකාර ආවරණය, ශල්‍ය කර්ම හා අසාධ්‍ය රෝග ප්‍රතිකාර ආවරණ ඇතුළු සුවිශේෂී ප්‍රතිලාභවලින් සමන්විත වේ. මෙම රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ මාධ්‍යවේදීන් විශාල වශයෙන් ප්‍රතිලාභ ලබාගෙන ඇති අතර මරණ පාරිතෝෂික 05 ක් ද පිරිනමා ඇත.

2.1.7 "ඇසිදිසි" ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන

ශ්‍රී ලාංකේය ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තියභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන වාර්ෂිකව ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාවට නංවනු ලැබේ.

වසර තුනක සේවා කාලය සපුරා ඇති, දිවයිනේ පිළිගත් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආයතනවල පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන පදනම මත සේවයේ නියැලී සිටින වයස අවුරුදු 18-55 ත් අතර මාධ්‍යවේදීන්, නිදහස් මාධ්‍යවේදීන්, ප්‍රාදේශීය මාධ්‍යවේදීන්, වෙබ් මාධ්‍යවේදීන් හා මාධ්‍ය තාක්ෂණ ශිල්පීන්ට මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා අයදුම් කළ හැකිය.

තවද ඉල්ලුම් කරන පාඨමාලාව සෘජුවම ජනමාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් වියයුතු අතර අයදුම්කරුවන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මඟින් ජනමාධ්‍යවේදීන් සඳහා නිකුත් කරන ජනමාධ්‍යවේදී හැඳුනුම්පත ලබා තිබිය යුතුය.

නොමිලේ ලබාදෙන මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය මඟින් මාධ්‍යවේදීන්ට දෙවරක් ප්‍රතිලාභ ලබාගැනීමට අවස්ථාව සැලසෙන අතර පළමු අවස්ථාවේ සුදුසුකම් ලබා පාඨමාලාව සම්පූර්ණ කර වසර 05 ක් ඉක්ම ගිය පසු දෙවන අවස්ථාව සඳහා අයදුම් කළ හැක.

මෙම වැඩසටහන 2006 වර්ෂයේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර 2021/2022 වර්ෂය සඳහා අයදුම් කළ ජනමාධ්‍යවේදීන් අතරින් ශිෂ්‍යත්වලාභීන් ලෙස 49 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය මඟින් තෝරා ගන්නා ලදී. 2021/2022 වර්ෂය සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමට මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලෙස රු. මිලියන 5.0 ක් ලබාදී ඇත. 2022.12.31 දින වන විට 2017, 2018, 2020 සහ

2021/2022 යන වර්ෂයන්ට අදාළව ශිෂ්‍යත්වලාභීන් 51 දෙනෙකු සඳහා සඳහා රු. මිලියන 2.20 ක ගෙවීම් සිදුකර ඇත.

2.1.8 ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීම

වෛරී සහගත ප්‍රකාශන (Hate speech) අවම කිරීම සඳහා ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීමට එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP) සමඟ එක්ව මාධ්‍යවේදීන් පුහුණු කිරීමේ වැඩසටහන් ආරම්භ කර ඇත.

2.1.9 ආනයනය කරන ලද ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ බද්ද වැඩසටහන් සඳහා බදු අයකිරීම

මෙම අමාත්‍යාංශය මඟින් 2016 අංක 11 දරන මුදල් පනත මඟින් පනවා ඇති නියෝගයන්ට අනුව රූපවාහිනී නාලිකා මඟින් විකාශනය කරනු ලබන ආනයනික වැඩසටහන් සඳහා බදු අය කෙරේ. 2022 වසරේ ආනයනික ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් 1382 ක් සඳහා නිශ්කාෂණ සහතිකපත් නිකුත් කර ඇති අතර අයකර ගනු ලැබූ බදු මුදල රු.මි. 215.02 කි. එය ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

2022 වසරේ බදු අයකරනු ලැබූ හා බද්දෙන් නිදහස් කරනු ලැබූ වැඩසටහන්

වැඩසටහන් වර්ගය	බද්දෙන් නිදහස් කරනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව	බදු අයකරනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව	බදු ආදායම (රු.මි.)
චිත්‍රපට	639	46	5.50
ටෙලි නාට්‍ය හා වාර්තා වැඩසටහන්	161	1205	174.20
වෙළඳ දැන්වීම් හා වෙළඳ වැඩසටහන්	-	131	35.30
එකතුව	**800**	**1382**	**215.00**

2.1.10 ජනමාධ්‍ය විෂය පථයට අයත් අනුබද්ධිත ආයතනයන්හි පනත් කාලීනව සංශෝධනය කිරීම

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ජනමාධ්‍ය විෂය පථයට අයත් වන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය, සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක් හවුස්), ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය හා ශ්‍රී ලංකා පදනම් ආයතනය යන ආයතන නීත්‍යානුකූලව පිහිටුවා ඇති පනත් හා සාංගමික ව්‍යවස්ථාවලි මීට වසර 40 කට පමණ පෙර එවකට පැවති ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස සකස් කර ඇති අතර මෑත කාලයේදී කිසිදු සමාලෝචනයකට ලක්කර නොමැත. එසේම, තැපැල් දෙපාර්තමේන්තුව, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන තමන්ගේ දෛනික රාජකාරී වලදී භාවිතා කරන අණ පනත්ද මීට දශක 05 කට පමණ පෙර සම්මත කර ඇති අණ පනත් වේ. කාලීන අවශ්‍යතාවයන්ට අනුගත වෙමින් පෞද්ගලික මාධ්‍ය හා සමාන කාර්යය හා සේවාවන් කරනු ලබන පෞද්ගලික ආයතන තරඟකාරී ලෙස

ඉදිරියට පැමිණ ඇතිමුත් යල් පැනගිය පනත් හා නීතිරීති තුළ සිරවී සිටීමට සිදුවීම හේතුවෙන් රාජ්‍ය මාධ්‍ය හා රාජ්‍ය ආයතන ඉදිරි ගමන මන්දගාමී වී ඇත.

එසේම, ඩිජිටල් තාක්ෂණය සමඟ මතුවිය හැකි ඉදිරි ගැටලු සඳහා ඉදිරියට ගැලපෙන ලෙස මෙම අමාත්‍යාංශ විෂය පථයට අයත්ව ඇති අණපනත් සංශෝධන විය යුතුව ඇති අතර ශීඝ්‍රයෙන් වෙනස් වන තාක්ෂණික සමාජ රුචිකත්වයට ගැලපෙන ලෙස කටයුතු කරමින් මාධ්‍ය ක්ෂේත්‍රයේ පවත්නා දැඩි තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දී එය ජයගැනීමට හැකියාව ලැබෙන ලෙසත්, ස්වාධීනව නැඟී සිටීමට අවශ්‍ය වන ආයතනික ව්‍යුහයන් සකස් කරගැනීමට අවකාශ සැලසීමටත්, ඒ සඳහා ගැලපෙන ලෙසත් දැනට පවත්නා අණ පනත් සංශෝධනය කිරීම ආරම්භ කර ඇත.

අ) 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත සංශෝධනය කිරීම

රාජ්‍ය ව්‍යාපාර පොදු කාරක සභාවේ නිර්දේශ මත 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 3 (1) වගන්තිය, භාණ්ඩාගාර නියෝජිතයකු සහ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියෝජිතයකු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස ඇතුළත් වන පරිදි සංශෝධනය කරන ලද අතර 2022 අංක 26 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත පාර්ලිමේන්තුවෙන් සම්මත කර නිකුත් කර ඇත.

ආ) 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම පනත සංශෝධනය කිරීම

1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම පනත සංශෝධනය සඳහා 2021.11.23 වන දිනැති අමප/21/1949/316/043 අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, "ශ්‍රී ලංකා පදනම් විශ්ව විද්‍යාලය - Sri Lanka Foundation University" යන නාමයෙන් පවතින ආයතනය සඳහා සංශෝධනයන් සිදුකර, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

ඇ) 1973 අංක 05 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම

පුවත්පත් මණ්ඩලය ව්‍යුහාත්මක ලෙස ප්‍රතිව්‍යුහගත කර විද්‍යුත්, මුද්‍රිත හා නව මාධ්‍ය ආවරණය වන පරිදි මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතන පිළිබඳ විනිශ්චය ආයතනයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීමට අදාළව පනත සංශෝධනය සඳහා 2021 ජනවාරි මස 12 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. නමුත්, ක්ෂේත්‍රයන්හි මතුවූ ගැටලුකාරී තත්ත්වයන් හේතුවෙන් පනත සංශෝධන කිරීමේ කාර්යය තාවකාලිකව නතර කර ඇත.

කෙසේ නමුත්, විද්‍යුත් මාධ්‍ය සහ සමාජ මාධ්‍ය සඳහා මේවන විට වෙනම නීතියක් හඳුන්වා දීම සඳහා යොමු කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුමැතිය ලැබී ඇත. පනත කෙටුම්පත් කිරීම සඳහා පත්කරන ලද මෙහෙයුම් කමිටුව විසින් අවශ්‍ය සංශෝධන සම්බන්ධව සාකච්ඡා කර ඇත.

ඈ) තැපැල් දෙපාර්තමේන්තු පනත සංශෝධනය කිරීම

1989 අංක 09, 1943 අංක 23, 1952 අංක 56, 1958 අංක 46 දරන පනත් මඟින් සංශෝධිත 1931 අංක 01 දරන තැපැල් කාර්යාල ඇප අරමුදල ආඥා පනත - 473 අධිකාරිය සංශෝධනය කිරීම.

මෙම පනත සංශෝධනය කිරීම සඳහා අංක 14/1751/525/010 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අමාත්‍යාංශයීය විෂය පථයන්හි වෙනස්වීම් මත කමිටු සාමාජිකයන්ගේ වෙනස්වීම් සිදුවීමද, ප්‍රථම අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් බොහෝ කාලයක් ගතවී ඇති බැවින්ද නැවත මෙම පනත සංශෝධනයට ඉදිරිපත් කරන ලද අංක 22/0312/316/004 දරන සංදේශය සඳහා 2022.03.07 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. දැනට පනත සංශෝධනය කිරීමට පත්කළ කමිටුව විසින් සකස් කරන ලද කෙටුම්පත සමාලෝචනය කරමින් පවතී. අනතුරුව අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය.

1955 අංක 31, 1957 අංක 24 දරන පනත මඟින් සහ 1973 අංක 06 දරන නීතියෙන් සංශෝධිත 1908 අංක 11 දරන තැපැල් කාර්යාල ආඥා පනතේ 190 අධිකාරිය සංශෝධනය කිරීම.

මේ සඳහා පත්කරන ලද කමිටුව විසින් ආඥා පනතේ වගන්ති 88 න් 40 ක් පූර්ණ අධ්‍යයනයට හා සමාලෝචනයට භාජනය කර අවසන්කර ඇති අතර ඉතිරි වගන්ති 48 අධ්‍යයනය කර සමාලෝචනය කළ යුතුව ඇත. අනතුරුව අවසන් කෙටුම්පත අධ්‍යයන වාර්තාවක් ලෙස අමාත්‍යාංශයට ලබාදීමටත් අමාත්‍යාංශයේ උපදෙස් අනුව මෙම ආඥා පනත සංශෝධනයට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට බලාපොරොත්තු වේ.

ඉ) ශ්‍රී ලංකා වරලත් ජනමාධ්‍යවේදී ආයතනය - Chartered Institute of Journalists - Sri Lanka යන නාමයෙන් ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීමේ පනත් කෙටුම්පත සකස් කිරීම

ඉහළ වෘත්තීමය නිපුණතා සහිත ජනමාධ්‍ය වෘත්තිකයන් බිහි කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල රජයේ අනුග්‍රහය සහිත ජනමාධ්‍ය වෘත්තීමය ආයතනයක් "ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය ''Chartered Institute of Media Professionals - Sri Lanka'' ව්‍යවස්ථාපිතව පිහිටුවීම සඳහා අවශ්‍ය පනත් කෙටුම්පත සකස් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

විද්වත් කමිටුවක් විසින් සකස් කරන ලද පනත් කෙටුම්පත අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

2021 සැප්තැම්බර් 24 වන දින ඉදිරිපත් කරන ලද "ශ්‍රී ලංකා වරලත් ජනමාධ්‍යවේදී ආයතනය - Chartered Institute of Journalists - Sri Lanka යන නාමයෙන් ජනමාධ්‍ය උසස් අධ්‍යාපන හා පර්යේෂණ ආයතනයක් පිහිටුවීම" යන මැයෙන් ගරු ජනමාධ්‍ය විෂයභාර අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2021 ඔක්තෝබර් මස 12 හා අමප/21/1749/316/036 - I අනුව අනුමැතිය ලැබී ඇත.

2.1.11 ප්‍රවෘත්ති වෙබ් අඩවි ලියාපදිංචි කිරීම

සෑම පුවත් වෙබ් අඩවියක්ම සිය වෙබ් අඩවිවල අන්තර්ගතය අචාරධර්මානුකූලව පවත්වාගෙන යන බව තහවුරු කර ගැනීම ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වගකීමකි. අංක 12/1037/37/019-1 සහ 13.08.2012 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රවෘත්ති වෙබ් අඩවි මෙම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කරනු ලැබේ. සෑම වෙබ් අඩවියක්ම ලියාපදිංචි කිරීම සඳහා රු. 25,000.00 ක් ද ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කිරීම සඳහා රු. 10,000.00 ක මුදලක් ද අමාත්‍යාංශය වෙත බැර කළ යුතුය. 2022 වර්ෂයේදී අමාත්‍යාංශය යටතේ නව ප්‍රවෘත්ති වෙබ් අඩවි 30 ක් ලියාපදිංචි කර ඇති අතර ප්‍රවෘත්ති වෙබ් අඩවි 32 ක ලියාපදිංචිය අලුත් කර ඇත.

2.1.12 ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය

රාජ්‍ය ප්‍රතිපත්තිය හා එමඟින් ලඟා කර ගැනීමට අපේක්ෂිත සංවර්ධන උපායමාර්ග හා එම සංවර්ධන ප්‍රයත්නයන්හි සැබෑ ප්‍රගතිය නිවැරදිව ජනතාව වෙත සන්නිවේදනය කිරීම මඟින් වර්තමානයේ සමාජ මාධ්‍ය හා අනෙකුත් මාධ්‍ය මඟින් රජයේ ප්‍රතිපත්ති හා සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳව විකෘති කරන ලද තොරතුරු සමාජගත වීම වළක්වා ගත හැකි වේ. රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන ප්‍රයත්නයන් පිළිබඳ නිවැරදි තොරතුරු හා දැනුමෙන් සන්නද්ධ වූ ජනතාවකට නිවැරදි දේශපාලන, ආර්ථික හා සමාජීය තීරණ ගැනීම පහසු වනු ඇත. මේ සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ගැසට් කර ඇති ආයතන හා සම්බන්ධීකරණය කරමින් කටයුතු කළ හැකි යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම මඟින් ඉහත අපේක්ෂිත අරමුණු ලඟා කර ගැනීමට රාජ්‍ය ප්‍රතිපත්තිය හා සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය නිවැරදිව ජනතාව වෙත සන්නිවේදනය කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදී.

මෙම මධ්‍යස්ථානය මගින් සිදු කරනු ලබන්නේ රටේ සංවර්ධන ක්‍රියාදාමය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ ජාතික සංවර්ධන කතිකාවතක් ගොඩනැගීම සඳහා වන වැඩසටහන් සම්පාදනය කිරීමයි.

2.1.13 ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

භෞමික රූපවාහිනී විකාශනය ප්‍රතිසම (Analog) ක්‍රමවේදයේ සිට අංකිත (Digital) ක්‍රමවේදය දක්වා ගමන් කරන ගෝලීය ප්‍රවණතාවයට ශ්‍රී ලංකාව ද අනුගත විය යුතුය. වර්තමානයේ පවත්නා තාක්ෂණය ක්‍රමයෙන් යල්පිනූ තත්ත්වයට පත්ව විකාශන පද්ධතිය නඩත්තු කිරීම හා අතිරේක රූපවාහිනී නාලිකා අවශ්‍යතාව සපුරාලීමේ අභියෝගයන්ට මුහුණපෑමට සිදුවී ඇත. ඉතාම කාර්යක්ෂම අංකිත (Digital) තාක්ෂණය පවතිද්දී තවදුරටත් ප්‍රතිසම (Analog) තාක්ෂණය භාවිතයෙන් සංඛ්‍යාත පරාසය (frequency spectrum) අපතේ යාමක් සිදුවන අතර එම සංඛ්‍යාත පරාස අනෙකුත් විදුලි සංදේශ සේවාවන්ට යොදා ගැනීමට ඇති හැකියාව මඟ හැරී යනු ඇත.

2009 වර්ෂයේදී DVB-T තාක්ෂණය හා 2010 වසරේ දී DVB-T2 තාක්ෂණය යටතේ දැනට පවත්නා ප්‍රතිසම (Analog) භෞමික රූපවාහිනී විකාශනය අංකිත (Digital) භෞමික රූපවාහිනි විකාශනය දක්වා පරිවර්තනය කිරීම ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය මෙන්ම විදුලි සංදේශ නියාමන

කොමිෂන් සභාව විසින් ද, විවිධ ක්‍රියාමාර්ග සහ සාධනීය පියවර කිහිපයක් ගෙන තිබුන ද, ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන නොවූ බැවින්, එය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

2009 වසරේ පළමු අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කළ දින සිට අංකිතකරණ (Digitalization) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ මුලිකත්වය ගෙන ක්‍රියා කරන ලද්දේ ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය වන අතර, තාක්ෂණික ප්‍රමිතීන් ස්ථාපිත කරමින් අංකිතකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා වන අංකිතකරණ විකාශන සැලැස්ම (Digital Broadcasting Road Map) සකස් කිරීම සඳහා පූර්ණ සහයෝගය ලබාදෙන ලද්දේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසිනි.

ඒ අතරතුර, ජපාන, JICA ආයතනය යටතේ කරන ලද ශක්‍යතා අධ්‍යයනයකින් අනතුරුව, ශ්‍රී ලංකාවට ගැලපෙන ලෙස ජපාන ISDB-T තාක්ෂණය සකස් කිරීම පිණිස යෝජනා විය. ඒ අනුව, ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස 2014 සැප්තැම්බර් මස 23 වන දින ශ්‍රී ලංකා රජය විසින් ජපාන සහන ණය ගිවිසුමකට (Soft Loan Agreement) අවතීර්ණ වෙමින් 2014 ඔක්තෝබර් මාසයේදී, ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය විසින් එහි කටයුතු ආරම්භ කරන ලදී.

2021 වසරේ දෙසැම්බර් මස අවසන් වීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක නොවූ බැවින් එවකට ජනාධිපතිතුමා තාක්ෂණ අමාත්‍යවරයා ලෙස හා ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා ඒකාබද්ධව යොමු කළ "ජපාන ණය ආධාර යටතේ ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම (SL-P112)" යන මැයෙන් වූ 2021 අප්‍රේල් 01 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමප /21/0621/316/016 හා 2021.04.28 දිනැති අමාත්‍ය මණ්ඩලය එළැඹී තීරණය මගින් මෙම ව්‍යාපෘතිය යාවත්කාලීන කරන ලද තාක්ෂණය සමග ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය.

අංකිත (Digital) තාක්ෂණයට අනුගත වීම මගින් රජයට අත්වන විශාලතම ප්‍රතිලාභය වන්නේ වර්තමානයේ භාවිතා වන සංඛ්‍යාත පරාසයෙන් (frequency spectrum) වැඩි ප්‍රමාණයක් මුදා හැරීමට ඇති හැකියාවයි. එබැවින් එම සංඛ්‍යාත පරාසය 5G නිරාහැන් පුළුල් පරාස (Broadband) සේවා සඳහා භාවිතා කිරීමට හැකිවන අතර, මෙමඟින් නවීනතම තාක්ෂණය ග්‍රාමීය ප්‍රදේශවලට ගෙනයාම පහසු වනු ඇත. තවද, අනාගතයේදී රූපවාහිනී නාලිකා ප්‍රමාණය වැඩි කර ගැනීමට ද හැකියාව ලැබේ.

සියලු විකාශන මෙහෙයුම්කරුවන් විසින් පවත්වාගෙන යනු ලබන තනි විකාශන ජාල වෙනුවට, අංකිත (Digital) විකාශන ජාල මෙහෙයුම්කරු (Digital Broadcast Network Operator - DBNO) ලෙස තනි මෙහෙයවන්නෙකු ස්ථාපිතවීම රූපවාහිනී විකාශකයා ලබන වාසියකි.

එමෙන්ම යල්පිනු ප්‍රතිසම තාක්ෂණය භාවිතා කරනු ලබන විකාශනාගාර නඩත්තුව සඳහා විශාල මුදලක් වාර්ෂිකව වැය කිරීමට විකාශන ආයතනවලට සිදු වන අතර, ව්‍යාපෘතිය අවසන් වූ පසු ඔවුන්ට තනි තනිව විකාශන ජාල නඩත්තු කිරීමට අවශ්‍ය නොවන අතර, මෙමඟින් නඩත්තු පිරිවැය ද විශාල ලෙස අඩුවනු ඇත.

ප්‍රතිසම (Analog) ක්‍රමවේදයේ අත්විඳිනු ලබන දුර්වල සංඥා ලැබීම වෙනුවට ඉතා උසස් අංකිත (Digital) රූප රාමු නැරඹීමට ඇති හැකියාව, තනි තනි රූපවාහිනී නාලිකා වෙනුවට

සියලු රූපවාහිනී නාලිකා සඳහා එක් ඇන්ටනාවක් නිවසෙහි ස්ථාපිත කිරීම ප්‍රමාණවත් වීම, සියලු දේශීය නාලිකා එක සමාන තත්ත්වයෙන් රසවින්දනය කිරීමේ හැකියාව සහ කිසිදු ගෙවීමකින් තොරව අධි විස්තෘත (High Definition - HD) රූපවාහිනී නැරඹීමේ අත්දැකීම ලැබීම ප්‍රේක්ෂකයා වෙත ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභය වේ.

මෙම ව්‍යාපෘතියට අදාළ සියළු මෙහෙයුම් කටයුතු හා කොළඹ ඇතුළු බස්නාහිර පළාත තුළ විකාශන කටයුතු කොළඹ නෙලුම් කුළුණ කේන්ද්‍රකොට ගෙන සිදු කිරීමට නියමිතය.

මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය ජපන් යෙන් මිලියන 17,717 කි. (JICA ආයතනයේ දායකත්වයේ වටිනාකම ජපන් යෙන් මිලියන 13,717 ක් ද, රජයේ දායකත්වය ජපන් යෙන් මිලියන 3,505 ක් ද වශයෙනි.)

ව්‍යාපෘතිය නිළ වශයෙන් එළිදැක්වීමේ සමාරම්භක උළෙල 2021.12.28 දින ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

2022 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතියේ ප්‍රගතිය

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ස්ථාපිත කර, 2021.07.15 දින මෙම ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කටයුතු ආරම්භ කරන ලදී.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2014.06.05 දින අනුමත කරන ලද කාර්යය මණ්ඩලයේ තනතුරු 27 න් තනතුරු 02 ක් හැර අනෙකුත් තනතුරු 25 සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට සැලසුම් කළද 2021.08.23 දින එම දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත්තේ 05 දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයක් සඳහා පමණි. ඒ අනුව දැනට සිව්දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයක් මගින් ව්‍යාපෘතියේ කටයුතු සිදු කරමින් පවතී.

(i) මෙහි තාක්ෂණික උපදේශන සහය ජපානය වෙතින් ලබා ගත යුතු බැවින් JICA ආයතනයේ එකඟතාව මත අදාළ ප්‍රසම්පාදන ක්‍රමවේද අනුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ උපදේශක ප්‍රසම්පාදන කමිටුව (CPCC) විසින් ව්‍යාපෘති උපදේශකවරයෙකු තෝරා ගන්නා ලදී. මෙහිදී, අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ තෝරාගත් උපදේශක ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ උපදේශන ගාස්තුව සාකච්ඡා වාර කිහිපයකින් පසුව රුපියල් බිලියන 1.3 කින් අඩු කර ගැනීමට ප්‍රසම්පාදන කමිටුවට හැකි විය. මෙය ශ්‍රී ලංකා රජය විසින් අත් කරගත් විශාල ප්‍රතිලාභයකි.

ඒ අනුව අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා එම ප්‍රසම්පාදන කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත.

දැනට රටෙහි පවතින ආර්ථික අර්බුදය මත ජපන් රජය විසින් ක්‍රියාත්මක සියලු JICA ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීමේ කටයුතු (Disbursement) තාවකාලිකව නවතා ඇති බැවින් එම කටයුතු නැවත ආරම්භ කළ පසු අදාළ උපදේශක ආයතනය සමඟ ගිවිසුම්ගතව උපදේශක සේවා ආරම්භ කිරීමට නියමිතය.

(ii) ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය සඳහා මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් හා මුදල් අමාත්‍යාංශය, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව නියෝජනය වන පරිදි සාමාජිකයන්ගෙන් ද, සමන්විත මෙහෙයුම් කමිටුවක් පත්කර කර ඇත. එහි නීරීක්ෂකයෙකු ලෙස JICA ආයතනය කටයුතු කරනු ලබයි.

(iii) ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වලට සමගාමීව මෙම ව්‍යාපෘතිය තුළින් දැනට පවතින ප්‍රතිසම (Analog) විකාශන කටයුතු නිමාවීමත් සමඟ නව අංකිත (Digital) පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට, දැනට රටතුළ පවතින අදාළ නීති පද්ධතිය මුලුමනින්ම සංශෝධනයට ලක්විය යුතුය. ඒ අනුව මෙම නීති කෙටුම්පත් සම්මත කර අවසානයේ ඩිජිටල් විකාශන ජාල මෙහෙයුම්කරු (DBNO) යන ආයතනය පිහිටුවීමට අවස්ථාව සැලසෙනු ඇත. මේ සඳහා වසර 02 ක පමණ කාලයක් ගත වනු ඇති බව නිමානය කර ඇත. ඒ අනුව මේ වන විට අමාත්‍යාංශය විසින් පත් කළ කමිටුවක් විසින් පනත කෙටුම්පත් කරමින් පවතී.

(iv) යෝජනා වී ඇති පරිදි රටපුරා විසිරී පවතින විකාශනාගාර 16 ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීම ද, මෙම ව්‍යාපෘතියේ මුල් අවධියේ උපදේශක සේවා ආරම්භ කිරීමට ප්‍රථම කළ යුතුව ඇත. ඒ අනුව මේ වන විට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ස්වාධීන රූපවාහිනී සේවය හා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ අත්සන් කිරීමට නියමිත අවබෝධතා ගිවිසුම් කෙටුම්පත් එම ආයතන වෙත යොමුකර ඇත. අනෙකුත් ඉඩම් පවරා ගැනීම් සඳහා අවශ්‍ය කටයුතු ද, සම්පාදනය කරමින් පවතී.

(v) 2022 වසර වෙනුවෙන් රු.මි. 119.50 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර 2022 දෙසැම්බර් 31 දින දක්වා වියදම රු.මි. 8.67 කි.

2.1.14 මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාදී ඇති ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

2.1.14.1 සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

වසන්තම් ටීවී නාලිකාව මෙරට දමිළ භාෂාව කතා කරන ශ්‍රී ලාංකික ජනතාව වෙත සුපැහැදිලි දසුන් නැරඹීමට හා දේශීය දමිළ වැඩසටහන් නිෂ්පාදනය කර විකාශනය කිරීමට හැකිවන පරිදි වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි මුළු ඇස්තමේන්තු මුදල රු.මි. 304 කි. 2022 වසර සඳහා මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස රු.මි. 50 ක් ලැබී ඇති අතර තාක්ෂණික උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.මි. 46.19 ක් වැය කර ඇත.

2.1.14.2 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

2022 වසරේ කොමිෂන් සභාව වෙත ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 1525 කි. 2022 වසරේදී විභාග කළ මුලු අභියාචනා සංඛ්‍යාව 1589 ක් වන අතර මෙයට 2021 වසරේදී කල්තැබූ අභියාචනාද ඇතුළත් වේ. විභාග කොට අවසන් නියෝග නිකුත් කරන ලද අභියාචනා සංඛ්‍යාව 1451 කි. 2023 වසරට කල් තබන ලද අභියාචනා සංඛ්‍යාව 124 ක් වන අතර ඉල්ලා අස්කර ගැනීම් 325 කි.

අභියාචනා සහ විධාන සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම, වාර්තා කළමනාකරණ වැඩි දියුණු කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන් යටතේ ප්‍රජා මූල සංවිධාන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ජාත්‍යන්තර තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් දිනය සැමරීම යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් හා විශ්වවිද්‍යාල සිසුන් හා උතුරු පළාත් ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම, කොමිෂන් සභා අරමුදල පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම, Afrial ආධාර යටතේ සමාලෝචන ක්‍රියාවලිය සිදුකිරීම සහ ලිපි ලේඛණ කළමනාකරණයට පොදු අධිකාරීන් සඳහා මාර්ගෝපදේශයක් පිළියෙල කිරීමේ මූලික කටයුතු ආදිය සිදු කර ඇත.

ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් වාර්ෂික ප්‍රතිපාදන ලෙස රු.මි. 1.0 ක් ලැබී ඇති අතර වියදම රු.මි. 0.99 කි.

2.1.14.3 ශ්‍රී ලංකා පදනම

ශ්‍රී ලංකා පදනම විවිධ විෂය ක්ෂේත්‍රයන් යටතේ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා 18 ක්ද, ජාතික ඩිප්ලෝමා පාඨමාලා 37 ක්ද, උසස් සහතිකපත්‍ර පාඨමාලා 09 ක්ද, සහතිකපත්‍ර පාඨමාලා 31 ක්ද ලෙස පාඨමාලා 95 ක් ඉලක්කගත කරන ලද අතර ඉන් පාඨමාලා 64 ක් අවසන් කර ඇත. ඉතිරි පාඨමාලා ඉදිරි වසරේදී නිම වනු ඇත. සැලසුම් කරන ලද වැඩමුළු 22 ම අවසන් කර ඇත.

ශ්‍රී ලංකා පදනම උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ලබාගැනීම සඳහා 1973 අංක 31 දරණ ශ්‍රී ලංකා පදනම පනත සංශෝධනයට අනුමැතිය ලැබී ඇත.

2022 වසරට ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස රු. මි. 20 ක් ලැබී ඇති අතර වියදම රු. මි. 10.40 කි.

2.1.14.4 ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

පුවත්පත් ලියාපදිංචිය යටතේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි සහ ත්‍රෙභාෂා වශයෙන් පුවත්පත් 145 ක් ලියාපදිංචි කර ඇත. 2022 වසරට අදාළ විභාග කිරීමට ඇති මුළු පැමිණිලි සංඛ්‍යාව 80 ක් වන අතර ඒ සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගෙන ඇත. මාධ්‍ය සමීක්ෂා IV කෘතිය එලි දක්වන ලදී. පුවත්පත් කලාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ 8 වන කණ්ඩායමේ පාඨමාලාව සහ සහතිකපත්‍ර පාඨමාලාවේ 1 වන කණ්ඩායමේ පාඨමාලාව අවසන් කර ඇත.

සන්නිවේදන විෂය ඉගැන්වීමේ නියැලෙන ගුරුවරු සඳහා වැඩ මුළු 03 ක්ද, මාධ්‍යවේදීන්, ගුරුවරුන්, සිසුන් සහ සන්නිවේදන විෂය සඳහා උනන්දුවක් දක්වන්නන් සඳහා වැඩසටහන් 12 ක්ද සහ සන්නිවේදන කතිකාවත් 10 ක්ද පවත්වා ඇත.

ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් වාර්ෂික ප්‍රතිපාදන ලෙස රු.මි. 3.0 ක් ලැබී ඇති අතර වියදම රු.මි. 2.42 කි.

2.1.14.5 ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව මෙරට සිනමා කර්මාන්තයේ පරිපාලනය සහ නියාමනය සඳහා ඇති එකම රාජ්‍ය ආයතනය වේ.

2022.12.31 දිනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ රිත්මා මණ්ඩලයේ සිනමාශාලා ගණන 42 කි. එහි 2022.12.31 දක්වා ප්‍රදර්ශනයවූ චිත්‍රපට සංඛ්‍යාව 106 කි. E- ticketing පද්ධතිය හඳුන්වාදීම සිනමාශාලා පරිගණකගත කිරීම සිදු කිරීමේ මූලික වැඩ කටයුතු 85% ක් පමණ අවසන් කර ඇත. සරසවි චිත්‍රාගාරයේ දෙබස් පටිගත කිරීම් මැදිරිය නවීකරණය කර විවෘත කිරීම සහ සිනමා පශ්චාත් නිෂ්පාදන උපකරණ සංරක්ෂණාගාරය විවෘත කිරීම සිදු කරන ලදී. ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව නව පනතක් හඳුන්වාදීම සඳහා මූලික සාකච්ඡා ආරම්භ කර ඇත.

2022 වසර සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස රු.මි. 25 ක් ද පුනරාවර්තන වියදම් ලෙස රු.මි. 100 ක් ද මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති අතර උපයෝජනය පිළිවෙලින් රු.මි. 24.83 ක් හා රු.මි. 97.49 කි. 2022.12.31 දින දක්වා මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් රු.මි. 32 ක ආදායමක් ලබා ඇත.

2.1.14.6 ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය

ලාංකීය සමාජයට බලපාන ප්‍රසිද්ධ රඟ දැක්වීම් සම්බන්ධයෙන් වන දේශීය චිත්‍රපට, නාට්‍ය සහ සියළුම මහජන සංදර්ශන ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩල පනත යටතේ මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු ද යන්න දැක්ම අනුව විමර්ශනය කෙරේ.

2022 වසර තුළ නිරීක්ෂණය කළ මුළු චිත්‍රපට සංඛ්‍යාව 174 කි. නිරීක්ෂණය කළ මුළු DVD සංඛ්‍යාව 82 ක් වන අතර සංගීත ප්‍රසංග සංඛ්‍යාව 332 කි. 2022 වර්ෂය සඳහා ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් ලෙස භාණ්ඩාගාරයෙන් රු. මි. 7.9 ක් ලබාදී ඇත. වියදම රු.මි. 3.94 කි. නව සිනමා ශාලාවේ නවීකරණය සහ ප්‍රක්ෂේපන යන්ත්‍රය, තිරය සහ ශබ්ද පද්ධතිය ස්ථාපිත කිරීමේ අවශ්‍ය මූලික වැඩ කටයුතු අවසන් කර ඇත.

2022 වසරේදී බලපත්‍ර නිකුත් කිරීම මගින් උපයාගන්නා ලද මුළු ආදායම රුපියල් මිලියන 4.83 කි.

2.2 අභියෝග

2.2.1 අලාභ මත පවත්වාගෙන යනු ලබන මාධ්‍ය ආයතන ලාභ ලබන ආයතන බවට පත් කිරීම

පෞද්ගලික මාධ්‍ය මෙන් නොව සංස්කෘතිය ආරක්ෂා කිරීම මෙන්ම සභ්‍යත්වය ද ආරක්ෂා කරමින් කටයුතු කිරීම රාජ්‍ය මාධ්‍ය ආයතන සතු වගකීමයි. එතෙකුදු වුවද, වර්තමානයේ පවතින

තරඟකාරීත්වය සමඟ නාලිකාවක ගුණාත්මකභාවය වෙනුවට අවිධිමත් විකාශන වර්ගීකරණයට යටත්ව විකාශන නාලිකා සඳහා දැන්වීම් සැපයීම හේතුවෙන් පුනරාවර්තන වියදම් පියවා ගැනීමට පවා රාජ්‍ය මාධ්‍ය ආයතන උපයන ආදායම ඔවුන්ට ප්‍රමාණවත් නොවේ. ජාතික න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහන් නිෂ්පාදනය කිරීම, විකාශය සහ තරඟකාරීත්වය සඳහා වැඩසටහන් නිෂ්පාදනය කිරීම හා විකාශය පරස්පර විරෝධී සාධක දෙකකි. මෙම ආයතන පාඩු ලැබීමට ප්‍රධාන සාධකය දරාගත නොහැකි මෙහෙයුම් කාර්ය වියදමයි. මෙම ආයතන අවම වශයෙන් සමායන ලක්ෂ්‍යයේ හෝ පවත්වා ගැනීමට ප්‍රතිව්‍යුහගත කළ යුතුය.

2.2.2 ශ්‍රී ලංකාවේ රූපවාහිනී විකාශන කටයුතු සඳහා අංකිත (Digital) තාක්ෂණය හඳුන්වා දීම

ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ප්‍රතිසම (Analog) තාක්ෂණය වෙනුවට ලෝකයේ බොහෝ රටවල් විසින් නව තාක්ෂණික තත්ත්වයන් යටතේ වැඩිදියුණු කරන ලද ඩිජිටල් තාක්ෂණය රූපවාහිනී ක්ෂේත්‍රය සඳහා හඳුන්වාදීම කාලීන අවශ්‍යතාවයක් වී ඇත. විශේෂයෙන්ම ප්‍රතිසම තාක්ෂණය ඉවත් වෙමින් පැවතීම නිසා එකී තාක්ෂණය මත පවත්නා විකාශන උපකරණ ඉදිරියේදී නඩත්තු කිරීම ගැටළු සහගතවේ. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය සපයා ගැනීම සහ 2028 ඉලක්කගත වර්ෂය වන විට අවසන් කිරීම හා පෞද්ගලික මාධ්‍ය ආයතන සම්බන්ධ කර ගැනීම අභියෝගාත්මකය.

2.2.3 ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම

වර්තමානයේදී, ආර්ථික, සමාජීය සහ දේශපාලනික භූමිකාවන්හි ඉතාම ශක්තිමත් හා තීරණාත්මක සාධකයක් බවට ජනමාධ්‍ය පත්ව තිබේ. ජනතාව වෙත තොරතුරු සමීප කරලීම පිණිස ජනමාධ්‍ය ධනාත්මක දායකත්වයක් සපයන අතර එමඟින් යහ පාලනය පවත්වාගෙන යාමට සහාය වේ.

ශ්‍රී ලංකාවෙහි ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සහතික කිරීමේදී නිදහස්, ස්වාධීන සහ ජනතා හිතකාමී මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීම වැදගත් වේ. මෙකී කර්තව්‍යය උදෙසා, යහ පාලනයත් ප්‍රජාතාන්ත්‍රවාදයත් පිළිබඳ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමෙහිලා ජනමාධ්‍යවේදීන්ගේ පාර්ශවයෙන් විශාල දායකත්වයක් අපේක්ෂා කෙරෙන අතර එබැවින්, රට තුල විවෘත මාධ්‍ය සංස්කෘතියක් ස්ථාපිත කිරීම සඳහා වෘත්තීය වශයෙන් බලගැන්වුනු ජනමාධ්‍යවේදී ප්‍රජාවක් පැවතිය යුතුය. පසුගිය දශක දෙක පුරාම, වෘත්තීය මාධ්‍යවේදීන් ජනිත කිරීමේ ආයතනයක් ස්ථාපිත කිරීමේ ප්‍රයත්නය සාර්ථක වී නොමැත. ජනමාධ්‍ය සමාජයට වගකිවයුතු වන නිසාම, ඉහළම මාධ්‍ය ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහතික කරමින් අදාළ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූලව වෘත්තීය මාධ්‍යවේදීන් බිහිකිරීම මගින් අත්‍යන්ත මාධ්‍ය භාවිතයේ විශිෂ්ටත්වය සාක්ෂාත් කරගැනීමේ සමාජ වගකීම ඉටුකරන ජාතික ආයතනයක් පිහිටුවිය යුතුවේ.

නවීන තාක්ෂණයේ දියුණුව හා ගෝලීය ප්‍රවණතා හේතුවෙන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ නිරන්තර වෙනස්කම් සිදු වෙමින් පවතින අතර, එවැනි වෙනස්කම් සිදු කිරීමේදී වෘත්තීය සංවර්ධනය, ධාරිතාව ඉහළ නැංවීම සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩ අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පැන නැඟී ඇත. ඒ අනුව, යෝජිත මාධ්‍ය ආයතනය පිහිටුවීම අතිශයින් වැදගත් වේ.

2.2.4 අපක්ෂපාතී විකාශන ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම

ගුවන් විදුලි හා දැන්වීම් ප්‍රචාරයේදී විකාශන ශ්‍රේණිගත කිරීම තීරණාත්මක සාධකයක් ලෙස බලපායි. විකාශන මධ්‍යස්ථානයන්හි වැඩසටහන් පෙළගැස්මේ සිට අන්තර්ගතයන් දක්වා බලපෑමකට ලක් කර ආර්ථික ශක්‍යතාවය අසමානුපාතික ලෙස පාලනය කිරීමේ හැකියාවක් ශ්‍රේණිගත කිරීම් දත්තවලට ඇත. රාජ්‍ය ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා පමණක් ක්‍රියාත්මකව තිබූ අවධියේ ශ්‍රේණිගත කිරීම් සිදු නොවූ අතර 1992 දී විකාශන ක්ෂේත්‍රයේ සීමා ලිහිල් කිරීමෙන් අනතුරුව පෞද්ගලික සමාගම්වලට ඉඩ ප්‍රස්ථාව ලබාදී වසර කිහිපයකට පසුව ශ්‍රේණිගත කිරීම ආරම්භ විය. දැන්වීම්කරුවන් විසින් මෙම ශ්‍රේණිගතකිරීම් පුළුල් ලෙස භාවිතා කළද ගුණාත්මකභාවය අගයන රාජ්‍ය මාධ්‍ය ආයතන මෙම ක්‍රමවේදය පිළිබඳව තෘප්තිමත් නැත. එබැවින් අපක්ෂපාතී ශ්‍රේණිගත කිරීම් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වේ.

2.2.5 විකාශන නියාමන පනත හඳුන්වාදීම

තාක්ෂණික සහ නෛතික ස්ථරයන්හි සිදුවෙමින් පවත්නා වූ වෙනස්කම් හා නිකුත් කරන ලද බලපත්‍රයන්හි පවත්නා ගැටළුකාරීභාවය මෙන්ම අතීතයේදී යම් අවස්ථාවන්හිදී මාධ්‍ය වල හැසිරීම පාදක කොට ගනිමින් රාජ්‍ය හා පුද්ගලික යන මාධ්‍ය ආයතන දෙපාර්ශවයම හැසිරවීම උදෙසා යම් ස්වාධීන ආයතනයක් පැවතිය යුතු බවට නිරීක්ෂණය විය.

2.2.6 රාජ්‍ය මාධ්‍ය ආයතනයන්හි තාක්ෂණික තනතුරු සඳහා නවකයින් ආකර්ෂණය නොවීම.

2.2.7 රාජ්‍ය මාධ්‍ය ආයතන නවීන තාක්ෂණයෙන් සවිබල ගැන්වීම.

2.2.8 ගුවන් විදුලි ඩිජිටල්කරණය

2.3 අනාගත ඉලක්ක

i) මාධ්‍ය නිදහස තහවුරු වන පරිදි වගකීම් හා වගවීම් සහිත මාධ්‍ය සදාචාරයක් බිහිකිරීම සඳහා අවශ්‍ය නියාමනයන් ක්‍රියාත්මක කිරීම.

ii) රටේ සියලු පුරවැසියන්ට තොරතුරු ලබාගැනීමේ ප්‍රවේශයන් පුළුල් කිරීම.

iii) මාධ්‍යවේදීන් දැනුමෙන් හා අත්දැකීමෙන් සන්නද්ධ කිරීම.

iv) මාධ්‍ය සාක්ෂරතාවය ඇති කිරීම.

v) මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක් හඳුන්වාදීම.

ලේකම්

ජනමාධ්‍ය අමාත්‍යාංශය

03 පරිච්ඡේදය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන

සමස්ත මූල්‍ය කාර්යසාධනය

ඒසීඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	2021 රු.	
262,000,000	ආදායම් ලැබීම්		215,020,000	438,470,000	
-	ආදායම් බදු	1	-	-	
262,000,000	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	215,020,000	438,470,000	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
262,000,000	මුළු ආදායම් ලැබීම් (අ)		215,020,000	438,470,000	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		112,146,000	284,805,000	ඒසීඒ-3
-	තැන්පතු		3,752,573	9,097,783	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		8,159,987	9,690,713	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**124,058,560**	**303,593,495**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**339,078,560**	**742,063,495**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		25,000,000	245,577,254	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		314,078,560	496,486,241	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
120,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	100,236,582	105,476,607	
73,430,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	62,674,652	65,557,717	ඒසීඒ-2(ii)
274,570,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	268,857,381	974,030,871	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
468,000,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**431,768,615**	**1,145,065,195**	
	මූලධන වියදම්				
41,100,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	36,483,987	103,649,866	
12,400,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	977,420	55,807,519	
49,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	38,654,810	65,781,566	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
6,000,000	හැකියා වර්ධනය	14	2,722,739	6,613,239	
173,400,000	වෙනත් මූලධන වියදම්	15	55,249,693	162,604,308	
281,900,000	මුළු මූලධන වියදම් (උ)		**134,088,648**	**394,456,498**	
	තැන්පතු ගෙවීම්		3,638,576	1,068,714	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		9,302,024	8,469,376	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		12,940,600	9,538,090	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		578,797,863	1,549,059,783	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(264,719,303)	(1,052,573,541)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(264,719,303)	(1,052,573,541)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-		ඒසීඒ-3
			(264,719,303)	(1,052,573,541)	

ඒසීඒ-8

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	395,452,001	403,168,644
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	16,478,603	15,336,566
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**411,930,604**	**418,505,210**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		8,323,391	7,295,351
දේපළ පිරියත හා උපකරණ සංචිතය		395,452,001	403,168,644
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	8,155,211	8,041,215
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**411,930,604**	**418,505,210**

පිටු අංක 7 සිට 44 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 45 සිට 51 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	..... 2023/02/24
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය :	දිනය :	දිනය :

ව.ජ.කේ. අනුෂ පැල්පිට
ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යාංශය
163, "ඇසිදිසි මැදුර", කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ-05.
2023/02/27

දුනිල් හෙයියන්තුඩුව
ප්‍රධාන ගණකාධිකාරී
ජනමාධ්‍ය අමාත්‍යාංශය
අංක: 163, "ඇසිදිසි මැදුර", කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

2

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කණ්ඩායම	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	215,020,000	438,470,000
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	9,342,623	48,622,901
අග්‍රිම ලැබීම්	112,146,000	284,805,000
අත්තිකාරම් අයකර ගැනීම්	6,818,331	8,982,498
තැන්පතු ලැබීම්	3,752,573	9,097,783
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**347,079,528**	**789,978,181**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	256,286,036	441,002,831
සහනාධාර සහ මාරුකිරීම්	39,000,394	37,365,871
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	12,876,678	1,123,107
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	25,000,000	245,577,254
අත්තිකාරම් ගෙවීම්	9,300,424	8,032,886
තැන්පතු ගෙවීම්	3,638,576	1,068,714
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**346,102,108**	**734,170,662**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**977,420**	**55,807,519**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භෞතික වත්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	977,420	55,807,519
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**977,420**	**55,807,519**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(977,420)**	**(55,807,519)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු.,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුදල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
1002.13.00	ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වානිජ වැඩසටහන් බද්ද	600,000	262,000	215,020	82%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්යසාධනය

රු.,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	468,000	468,000	431,7689	92%
ප්‍රාග්ධන	281,900	281,900	134,089	48%
එකතුව	749,900	749,900	565,857	75%

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01.	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	2022.01.03 හා 2022.04.01 දින බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් වෙත වැටුප් හා දීමනා ගෙවීම.	12,682	12,682	12,471	98%
02.	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය	ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම.	200	200	198	99%
03.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිතයෙන් පියවා ගැනීම සඳහා	208	208	208	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	57,533	57,533		
9152	යන්ත්‍රෝපකරණ	80,919	80,919		
9153	ඉඩම්	257,000	257,000		
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		
9160	කෙරීගෙන යන වැඩ	-	-		
9180	බදු දෙන ලද වත්කම්	-	-		

3.9 විගණකාධිපති වාර්තාව

කාර්යසාධන වාර්තාව අවසානයේ අමුණා ඇත.

04 පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

	විශේෂිතවූ දර්ශක	තත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස			
		100% - 90%	75% - 89%	50% - 74%	0% - 49%
1	විකාශන නීතිය කෙටුම්පත් කිරීම	100%	-	-	-
2	තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීම	-	80%	-	-
3	වෘත්තීය මාධ්‍යවේදීන් බිහි කිරීම				
3.1	ඇසිඩිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන	100%	-	-	-
3.2	මාධ්‍යවේදීන් සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා පනත කෙටුම්පත් කිරීම (ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය)	100%	-	-	-
4	මාධ්‍යවේදීන් සඳහා පහසුකම් සැලසීම				
4.1	මාධ්‍යවේදීන් සඳහා රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම	100%	-	-	-

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වගකීම් සහගත මාධ්‍ය සංස්කෘතියක් බිහිකිරීම සඳහා පහසුකම් සලසන අතරතුර මාධ්‍ය ක්‍රියාකාරීත්වයෙහි විශිෂ්ටත්වය කරා ප්‍රවිශ්ට වීම.

අරමුණ/ පරමාර්ථය	ඉලක්කය (ගෝලීය ඉලක්කය)	සාක්ෂාත් කර ගැනීම සඳහා වන දර්ශක	වර්තමානය වන විට සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
4. ගුණාත්මක අධ්‍යාපනය	4.4 2030 වන විට රැකියා, සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වය සඳහා අවැසි තාක්ෂණික සහ වෘත්තීය නිපුනතා ද ඇතුලු අදාල නිපුනතා සහිත තරුණ සහ වැඩිහිටි ජනගහනය ක්‍රමිකව වැඩි කිරීම.	ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය (Chartered Institute of Media Professionals – Sri Lanka) පිහිටුවීම.	20%		
		ඇසි දිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම.			100%
16. සාමය යුක්තිය සහ ශක්තිමත් ආයතන	16.10 ජාතික නීතිය සහ ජාත්‍යන්තර ගිවිසුම් ප්‍රකාරව තොරතුරු වලට මහජනතාවට ප්‍රවේශ වීමේ හැකියාව සහතික කොට මූලික නිදහස තහවුරු කරලීම.	තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පනත පිළිබඳව			
		අ) පුහුණුකරුවන් පුහුණු කිරීම	30%		
		ආ) තොරතුරු නිලධාරීන් සහ රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම (අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ සියලු ආයතන සඳහා)	6%		

		ඇ) ජාත්‍යන්තර තොරතුරු දිනය වෙනුවෙන් වැඩමුළුවක් සංවිධානය			100%
		ඈ) තොරතුරු නිලධාරීන් සඳහා අත්පොත් මුද්‍රණය කර බෙදාහැරීම			100%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ :

i) වෘත්තීය ජනමාධ්‍යවේදීන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයට බිහි කිරීමේ අරමුණින් ජාතික ජනමාධ්‍ය ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යාපෘති වාර්තාව මෙම අමාත්‍යාංශය මඟින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අතර එම දෙපාර්තමේන්තුව ප්‍රතිපත්තිමය වශයෙන් මෙම ව්‍යාපෘති සංකල්පයට එකඟතාවය පල කර ඇත. 2020.08.09 දින අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව තෘතීක අධ්‍යාපන ආයතනයක් වන ශ්‍රී ලංකා පදනම් ආයතනය මෙම අමාත්‍යාංශයීය විෂය පථය යටතට පත් කිරීමත් සමඟම එම ආයතනය සමඟ ඒකාබද්ධව ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයින්ගේ ආයතනය පිහිටුවීමට අවශ්‍ය පනත කෙටුම්පත් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්වතුවට යොමු කර ඇත.

ii) තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ක්‍රියාත්මක කර එය සමාජගත කිරීමේ වගකීම මෙම අමාත්‍යාංශය විසින් දරනු ලබන අතර මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමෙහිලා මේ සඳහාම වෙන්වූ ඒකකයක් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇත. පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධ සියළු කටයුතු මෙම ඒකකය හරහා සිදු කෙරේ. තවද 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි 11 වන වගන්තිය ප්‍රකාරව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පොදු අධිකාරීන් සුපරීක්ෂණය කිරීමෙහි සහ තොරතුරු නීතිය බලාත්මක කිරීමේ ආයතනය වශයෙන් ස්ථාපිත කරන ලදී.

අභියෝග :

i) රාජ්‍ය ආයතන අතර සුසංයෝගයක් ඇති කර ගැනීම හරහා සාමූහික ක්‍රියාමාර්ග හඳුනා ගැනීම හා ඒකාබද්ධ සැලසුම්කරණයකට ප්‍රවිෂ්ඨ වීම.

ii) තාක්ෂණයේ ප්‍රගමනයත් සමඟ මාධ්‍ය ක්ෂේත්‍රයට සරිලන පරිදි රාජ්‍ය මාධ්‍ය ආයතන නවීන තාක්ෂණයෙන් සවිබල ගැන්වීම.

iii) මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා පෞද්ගලික මාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍ය කාර්යක්ෂමව යොදා ගැනීම.

iv) තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මාධ්‍ය සහය ලබාදීමට රාජ්‍ය මාධ්‍ය ආයතන සඳහා ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන නොලැබීම.

v) අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණ කර ගැනීම මෙතෙක් ඉටු කරගත නොහැකිවීමෙන් ඵලදායී ක්‍රියාකාරිත්වයට බාධා පැමිණීම.

vi) පොදු අධිකාරීන් හා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව සම්බන්ධකර ජාලගතකිරීම අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් සිදුකිරීම.

vii) මහජන සම්බන්ධතාවය නිරතුරුව සිදුකිරීමට අවශ්‍ය පහසුකම් සහිත ඒකකයක් පිහිටුවීම.

viii) අන්තර්ජාතික මට්ටමේ මාධ්‍ය වෘත්තිකයන් බිහි කිරීම.

ix) රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශය සමඟ විශිෂ්ඨ ගුණාත්මක මාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීම.

x) නව මාධ්‍ය අනිසි ලෙස යොදා ගැනීම වලකා මාධ්‍ය සාක්ෂරතාවය මඟින් මාධ්‍ය හරහා සිදුවන හිංසනයන් හා අපචාර අවම කිරීම.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	25	17	08	-
තෘතීයික	06	02	04	-
ද්විතියික	89	72	07	-
ප්‍රාථමික	38	21	17	-
එකතුව	**158**	**112**	**36**	**-**

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

කාර්ය මණ්ඩලයේ සේවකයින් 36 ක හිඟයක් පවතී. ජ්‍යෙෂ්ඨ හා ප්‍රාථමික කාර්ය මණ්ඩල තනතුරුවල පුරප්පාඩු පැවතීම ආයතනයේ කාර්යසාධනය උදෙසා සෘණාත්මකව බලපා ඇත.

ශ්‍රම බලකායට හිඟයක් ඇති විට, සෑම සේවකයෙකුටම පැවරෙන අතිරේක රාජකාරි කටයුතු ප්‍රමාණය නිසි වේලාවට අවසන් කිරීම සඳහා මානසික ආතතියකින් සහ තෘප්තිමත්භාවයකින් තොරව කටයුතු කිරීමට සිදුවේ. එය කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය පහළ හෙලන අතරම සමස්තයක් ලෙස ආයතනයේ කාර්ය සාධනය අවම කරයි. ආයතනයේ නියමිත රාජකාරි ඉටුකිරීමේදී ප්‍රශස්ත මට්ටමින් රාජකාරි සම්පූර්ණ කිරීමට බාධාවන් ඇති වේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

පාඨමාලා/ පුහුණු වැඩසටහනෙහි නම	පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය	වැඩසටහන් කාලය	මුළු ආයෝජනය (රු.)		වැඩසටහනෙහි ස්වභාවය (විදෙස් / දේශීය)	සාක්ෂාත් කරගත් ප්‍රතිඵල/දැනුම
			දේශීය	විදෙස්		
Master of Law in Public Law	01	වසර 02	359,500	-	දේශීය	අමාත්‍යාංශයේ විෂය පථය හා නිළධාරියාගේ සේවා පථයට අනුකූල විෂය දැනුම.
Higher National Diploma in Public Procurement	01	වසර 01	120,000	-	දේශීය	රජයේ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ දැනුම.
Advance Certificate Course in Public Procurement	01	සති 10	30,000	-	දේශීය	රජයේ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ මූලික දැනුම.
Tamil Language Programm	50	පැය 12	9,000	-	දේශීය	භාෂා කුසලතාවය ඉහළ නැංවීම
මාර්ගගත පුහුණු						
KOICA Fellowship Programme – 2022	40	දින 12	-	-	විදේශීය මාර්ගගත	Artificial Inlelligence ජනමාධ්‍යවේදය විෂයට අදාළ තාක්ෂණික දැනුම
China Multicultural Programme	23	දින 19	-	-	විදේශීය මාර්ගගත	නිළධාරී පුද්ගල සංවර්ධනයට පාදක වන දැනුම.
JICA Knowledge Co-creation Programme	04	දින 04	-	-	විදේශීය මාර්ගගත	ඩිජිටල් ව්‍යාපෘති කාර්යමණ්ඩලයට අදාළ දැනුම.
DTTB Policy & Engineering Programme	04	දින 18	-	-	විදේශීය මාර්ගගත	ඩිජිටල් ව්‍යාපෘතියට අදාළ කටයුතු සම්බන්ධ පුහුණුව
එකතුව	**124**	-	**518,500**	-	-	-

6.4 ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය

නිලධාරීන් පුහුණු පාඨමාලාවන්ට යොමු කිරීමේ අරමුණ නම් කාර්යාලීය වැඩකටයුතු නිසි අයුරින්, ක්‍රමවත්ව හා කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමට ඔවුන් පොළඹවා ගැනීමයි. පුහුණු පාඨමාලා, නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කරන අතර ඔවුන්ගේ හැකියා වර්ධනය වැඩිදියුණු කිරීමටද ඉවහල් වේ.

නිළධාරීන්ගේ දැනුම, කුසලතා, ආකල්ප හා නිර්මාණශීලීත්වය වර්ධනය කිරීම අපේක්ෂාවෙන් පුහුණු හා දේශීය හා විදේශීය වැඩසටහන් සඳහා නිළධාරීන් යොමුකිරීම සිදුවේ. මෙය අමාත්‍යාංශයේ කාර්යයන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීමට මෙන්ම සේවක අභිප්‍රේරණයට හේතුවේ. මෙමගින් අමාත්‍යාංශයේ සමස්ථ කාර්යසාධනය ඉහළයාම සිදුවේ.

රාජ්‍ය අංශයට නවක පත්වීම් ලැබ අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලද නිලධාරීන් අනිවාර්ය පුහුණු පාඨමාලාවලටද යොමු කරන අතර මෙමගින් ඔවුන් රැකියාවට වඩා හොඳින් අනුගත වේ.

තවද මෙම පුහුණු පාඨමාලා තුළින් නිලධාරීන්ට රාජකාරී පරිසරයේ ඒකාකාරී බවින් මිදීමට හා නව දැනුමින් සන්නද්ධ වීමට අවස්ථාව ලැබේ.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ.	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ.	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ.	-	-
1.6	වෙනත්	අදාළ නොවේ.	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු..රේ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම.	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ.	-	-
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ.	-	-
3.4	2014.05.11 දිනැති 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ.	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ.	මාසයක කාල සීමාව තුල පිළිතුරු සපයා නොතිබීම.	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී ආයතන හා අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය	අනුකූල වේ.		

	ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.			
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල නොවේ.	රටේ පැවති ගැටළු සහගත තත්වය	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ.	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම.	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.	-	-

9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල නොවේ.	ලංකා පූවත් ආයතනයට අයත් වාහනය පවරා ගැනීමට කොම්ප්ට්‍රෝ ජෙනරාල් වෙත දන්වා ඇත.	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ.	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ.	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල්කර තිබීම.	අනුකූල වේ.	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ.	-	-
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ.	-	-
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.	-	-

12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
14	**අග්‍රීම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ.	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරිය අතුරු අග්‍රීම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		-
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රීම නිකුත් කර තිබීම.	අනුකූල වේ.	-	-
14.4	අග්‍රීම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ.	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අදාළ නොවේ.	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ.	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම.	අනුකූල වේ.	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ.		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-

17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ.	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ.	සකස් කරමින් පවතී.	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ.	සකස් කරමින් පවතී.	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.	-	

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ.	-	
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ.	-	

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } සිඒඑම්/ඒ/එම්එම්/එෆ්ඒ/2022/18

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2023 මැයි දින.

ජනමාධ්‍ය අමාත්‍යාංශය
වේලාව
31 MAY 2023
මුදල් අංශය
ජනමාධ්‍ය

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
ජනමාධ්‍ය අමාත්‍යාංශය.

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව මැයි 29 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්

ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය වර්ෂය තුළ ගෘහ භාණ්ඩ මිලට ගැනීමට රු.809,421 ක් හා යන්ත්‍ර උපකරණ මිලට ගැනීමට රු.167,999 ක් වැයකර තිබුණ ද, භාණ්ඩාගාර සටහනේ SA 82, එම අගය ආරම්භක ශේෂයට ගැලපීමක් ලෙස දක්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන (SA 82 ආකෘතිය) අනුව දෙසැම්බර් 31 දිනට 9152 යටතේ ඇති යන්ත්‍ර උපකරණ වටිනාකම රු.80,919,002 ක් වුවත්, කෙටුම්පත් වාර්ෂික වාර්තාව අනුව එම ශේෂය රු.89,597,000 ක් ලෙස දැක්වීමෙන් රු.8,677,998 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොකිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

ලේඛන වර්ගය	අදාල රෙගුලාසිය
ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 891
බැරකම් ලේඛනය	මුදල් රෙගුලාසි 447(5)

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වානිජ වැඩසටහන් බද්ද මඟින් ලබා ගැනීමට ඇස්තමේන්තු කර තිබූ අදායම රු.262,000.000 ක් වුවද අමාත්‍යාංශය විසින් 2022 වර්ෂය සඳහා ලද ශුද්ධ ආදායම රු.215,020,000 ක් වූයෙන් සියයට 18ක් අඩුවෙන් ආදායම රැස්කර තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, තම අමාත්‍යාංශයට අදාළ කෙටුම්පත් ඇස්තමේන්තු, මුදල් රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කරන බවට වගබලා ගැනීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ.

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ පුනරාවර්තන වැය විෂයයන් 04කින් පුනරාවර්තන වැය විෂයයන් 08 ක් වෙත සලසා තිබුණු රු.12,961,918 ක් මු.රෙ **66** මඟින් ප්‍රතිපාදන මාරු කර තිබූ බැවින් මුදල් රෙගුලාසිවල අවශ්‍යතා සපුරාලන පරිදි කටයුතු කරමින් තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) වැය විෂයයන් 03 ක් සඳහා සලසාගෙන තිබූ රු.525,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන වලින් සියයට 100 ක් හා තවත් වැය විෂයයන් 21ක් සඳහා සලසාගෙන තිබූ රු.181,525,000 ක් ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.149,009,721 ක් උපයෝජනය නොකර පැවති අතර එය සියයට 33 සිට සියයට 98 දක්වා ප්‍රතිශතයක් විය.

(ඇ) වැය විෂයයන් 04 ක ප්‍රතිපාදනයන් මු.රෙ. 66 මඟින් වෙනත් වැය විෂයයන්වලට මාරු කිරීමෙන් පසුද වැය විෂයයන් 03 ක සියයට 21 සිට සියයට 84 දක්වා පරාසයක් තුළ ඉතිරිවී තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හි 03 xvi ඡේදය පරිදි අනවශ්‍ය හා ප්‍රමුඛතා නොවන වියදම් අත්හිටුවීම සහ ඒවා සඳහා රාජ්‍ය මුදල් භාවිතා නොකිරීම කළයුතු වුවත් චක්‍රලේඛයට පටහැනිව බෝධි පූජා පිංකමක් සඳහා රු.34,903 ක් රාජ්‍ය මුදල් වැය කර තිබුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතුය. එසේම ඒ වෙනුවෙන් දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා සලසා තිබූ ප්‍රතිපාදන මුදල්

සීමාව නොඉක්ම විය යුතුය. කෙසේ වෙතත් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ බැරකම්වල දක්වා තිබූ 105-1-3-1402 වැය විෂයයෙන් ප්‍රතිපාදන කර තිබූ මුදල ඉක්මවා රු.252,582 ක් බැරකම් වලට එළඹ තිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ මාර්ගෝපදේශයේ 3.3 ප්‍රකාර මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම අංක III යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය, භාණ්ඩාගාරය එක් එක් වියදම් ශීර්ෂවලට අදාළව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශන (SA 92) සමග සැසඳී තිබිය යුතු වුවත් අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.2,480,310ක් වුවත්, භාණ්ඩාගාර වාර්තා අනුව එම ශේෂය රු.1,233,641ක් විය. ඒ අනුව රු.1,246,669 කින් සැසඳී නොතිබුණි.

2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර, ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මු.රෙ.104	අමාත්‍යාංශයට අයත් වාහන 03 ක් 2022 වර්ෂය තුළදී අනතුරකට ලක්වී තිබූ අතර මෙම අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	(ii) මු.රෙ. 880	රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව අමාත්‍යාංශයේ නිලධාරීන් 15 දෙනෙකු පමණ ඇප තබා නොතිබුණි.
	(iii) මු.රෙ. 1645(අ)	වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි .
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි II කොටසෙහි 5.1 ඡේදය හා 2022 දෙසැම්බර් 20 දිනැති අංක 01/2020 (11) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	සියලුම රජයේ ආයතන, තම ආයතනය විසින් සේවාවන් සඳහා අයකරන ගාස්තු සමාලෝචනය කර වසර තුනකට වරක් සියයට 15 ක උපරිමයකට යටත්ව සංශෝධනය කළයුතු වුවද අමාත්‍යාංශය විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. තවද 2020, 2021 සහ 2022 වර්ෂවලදී ගාස්තු ඉහළ නැංවීමක් සිදුකර නොමැති සියලු රාජ්‍ය ආයතන විසින් සිය ගාස්තු සියයට 20 කින් ඉහළ නැංවීමක් සිදුකර 2023 මාර්තු 31 දිනට පෙර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළයුතු බව අවධාරණය කර තිබුණ ද, අමාත්‍යාංශය විසින් මේ වන තෙක් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හි	
	(i) 3.1 වගන්තිය	අමාත්‍යාංශය සතු වාහන 32 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි.
	(ii) 4.4 වගන්තිය	කොළඹ, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාවේ සහ කෝට්ටේ නගර සභා සීමාවේ පිහිටි ගරාජවලින් මිල ගණන් කැඳවිය යුතු වුවත් ඊට පටහැනිව අමාත්‍යාංශය විසින් වාහන 02 ක් අලුත්වැඩියාව සඳහා ඉහත නගර සභා සීමාවලින් පිට ගරාජවලින් ද ඇස්තමේන්තු කැඳවීමට කටයුතු කර තිබුණි.

(ඇ) 2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ

(i) I කොටසේ 9 මඟින් සංශෝධිත මු.ගෙ. 371(5) ඡේදය	තත්කාර්යය අතුරු අග්‍රිමය ලබාගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිම පියවිය යුතු වුවත්, එකතුව රු.694, 195ක් වූ අත්තිකාරම් 27 ක් දින 14 සිට මාස 08 ක පරාසයක් දක්වා අත්තිකාරම් පියවීම ප්‍රමාද වී තිබුණි.
(ii) I කොටසේ 11.1 මඟින් සංශෝධනය කරන ලද මු.ගෙ. 756 (6)	සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කර එහි වාර්තාව ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු නමුත් 2023 අප්‍රේල් 12 දින වන විටත් භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.6 අවධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නියෝජිත ආයතනය මඟින් රථයක් පින්තාරු කර ගැනීම, ප්‍රථම අවස්ථාවේදී සිදු නොකිරීම හේතුවෙන් රු.89,864 ක් වැඩියෙන් දැරීමට සිදුවී තිබුණි.

(ආ) ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය

(i) 2021 පෙබරවාරි 02 දින සිට මධ්‍යස්ථානය සඳහා කාර්ය මණ්ඩලය වරින් වර බඳවා ගැනීම හා සේවය දීර්ඝ කිරීම් සිදුකර තිබුණ ද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) අංක PS/OB/7/162/2022 (N) හා 2022 දෙසැම්බර් 14 දිනැතිව ජනාධිපති කාර්යාලයෙන් මධ්‍යස්ථානයේ ඉදිරි පැවැත්ම සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු සම්බන්ධයෙන් ලිපියක් යොමුකර තිබුණු අතර, ඒ සඳහා විගණිත දින වූ 2023 මාර්තු 03 වන දින තෙක් පිළිතුරු ලබාදී නොතිබුණි.

(iii) මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණ රාජ්‍ය ප්‍රතිපත්තිය හා සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය නිවැරදිව ජනතාව වෙත සන්නිවේදනය කිරීම සඳහා වුවද එවැනි කාර්යයක් සිදුකළ බවට විගණනයේදී සාක්ෂි අනාවරණය නොවීය.

2.7 රජයේ නිලධාරීන්ගෙ අත්තිකාරම් ගිණුම

සේවය අතහැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.269,096 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට 2022 පෙබරවාරි 28 දක්වා ක්‍රියාකර නොතිබුණි. එහි වර්ෂ 05 ට වැඩි රු.22,588 ක ණය ශේෂයක්ද පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක PED/RED/01/01/2020/02 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 ප්‍රකාරව සියලුම රජයේ ආයතන තම ආයතන වෙනුවෙන් සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු අතර, ඊළඟ වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස්කර ප්‍රධාන ගණුන් දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වුවද එදිනට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අංක PED/RED/01/01/2020/02 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 12 අනුව ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් විය යුතු ක්‍රියාත්මක කාල රාමුව හා අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (output/ outcome), වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදී තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 38 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරකම් 10 ක ප්‍රගතිය සියයට 50කට අඩු ප්‍රතිශතයක් වී තිබුණි.

(ආ) 2022 වර්ෂය සඳහා ආනයනය කරන ලද ටෙලිනාට්‍ය, චිත්‍රපටි හා වාණිජ වැඩසටහන් සඳහා නිෂ්කාශන සහතික 1382 ක් නිකුත් කර තිබූ අතර, ඒ සඳහා රු.215,020,000 ක් බදු ලෙස අයකර තිබුණි. 2021 වර්ෂයේ එම ආදායම රු.438,470,000 ක් විය. ඒ අනුව සියයට 51 කින් ආදායම අඩු වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය 2014 ආරම්භ කළද ක්‍රියාත්මක නොවීම නිසා නැවත 2021 වර්ෂයේ කැබිනට් මණ්ඩල තීරණයක් පරිදි යාවත්කාලීන කරන ලද අතර, තාක්ෂණය සමග ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී තිබුණි. ඒ තුළින් රට පුරා විසිරී පවතින විකාශනාගාර 16 ක් ස්ථාපිත කිරීමට නියමිත වුවත්, විගණිත දිනය වන 2023 අප්‍රේල් 12 වන විටත් එක් විකාශනාගාරයක් හෝ ස්ථාපිත කිරීමට නොහැකිවී තිබුණි. 2022 වර්ෂය සඳහා රු.මිලියන 119.50 ක් ලැබී තිබුණ ද, උපයෝජනය කර තිබුණේ රු.මිලියන 8.67 කි.

3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2021 දෙසැම්බර් 10 දිනට ප්‍රථම ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඉදිරිපත් කර තිබුණේ 2022 ජනවාරි 10 දිනදීය.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු අතර ඊළඟ වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළයුතුය. නමුත් ජනමාධ්‍ය අමාත්‍යාංශය සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම 2022 වර්ෂය සඳහා පමණක් වූ අතර, ප්‍රසම්පාදන සැලැස්ම 4.2.2(ඉ) ප්‍රකාරව මාස 06 කට වරක් යාවත්කාලීන කර නොතිබුණි.

(ඇ) ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් 2021 ,2022 වර්ෂ වල සිදුකල ප්‍රසම්පාදන කටයුතු පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගෘහභාණ්ඩ මිලදී ගැනීම හා අභ්‍යන්තර අලංකරණ කටයුතු 2021 ඔක්තෝබර් 28 දින New Interior (Pvt) Ltd ආයතනයට රු.39,262,200 ක හා අවිනිශ්චිත වියදම් සියයට 10 ඇතුළු මිලකට (බදු රහිත) කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණද 2022 අගෝස්තු 29 දින වන විට රු.40,475,229 ක් ගෙවා තිබුණි.

(ii) ජනමාධ්‍ය අමාත්‍යාංශ පරිශ්‍රය අභ්‍යන්තර අලංකරණය හා නවීකරණය, ප්‍රසම්පාදනය වෙනුවෙන් ලිපිගොනු නඩත්තු, ප්‍රසම්පාදන කැඳවීම, පිරිවිතර පරීක්ෂා කිරීම, බිල්පත්වලට ගෙවීම, ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් යන සියලුම කාරණා සඳහා ගිණුම් අංශයේ ප්‍රධාන නිලධාරී සිට සෙසු නිලධාරීන් එම ක්‍රියාවලියට සම්බන්ධ වීම තුළින් ගනුදෙනුවල අපක්ෂපාතීත්වය, අවංකභාවය හා විනිවිදභාවය ගිලිහී යාම කෙරෙහි අවදානමක් ඇතිවී තිබුණි.

(iii) ශ්‍රවණාගාර නවීකරණය සඳහා රු.5,923,727 ක ඇස්තමේන්තුව නොසලකා රු.8,093,410 ක් වූ ඇස්තමේන්තුවක් පිළිගැනීම තුළින් අමාත්‍යාංශයට රු.2,169,683 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(iv) අමාත්‍යාංශයේ සංවර්ධන හා සැලසුම් අංශය සඳහා කාර්යාලයීය ඉඩකඩ ලබා ගැනීමට අතිරේක ස්ථානයක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ලංසු කැඳවීමකින් තොරව ප්‍රසම්පාදන කමිටු තීරණය මත සිදුකර තිබුණි.

(v) (a) අමාත්‍යාංශ පරිශ්‍රය පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ ප්‍රසම්පාදනයේදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 අනුව ලංසු සුරක්ෂණ/ ලංසු සුරක්ෂණ ප්‍රකාශ සම්මත පරිදි ඉදිරිපත් නොකිරීම නිසා අවම ලංසුව උපදේශක ආයතනය විසින් ප්‍රතික්ෂේප කර තිබුණු අතර. නඩත්තු පිරිවැය අන්තර්ගත කර නොමැති අංශ නොමිලේ සේවා සැපයීමට යටත්ව දෙවන ලංසුව උපදේශක ආයතනය විසින් නිර්දේශ කර තිබුණද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සම්මත ප්‍රසම්පාදන ලිපිවල අඩුපාඩු පවතින බවට කොන්ත්‍රාත්කරු නිර්දේශ කරමින් අවිධිමත් තීරණයකට එළඹ තිබුණි.

(b) උපදේශක ආයතනය විසින් නිර්දේශ කළ කොන්ත්‍රාත්කරු ඉවත් කර ඇගයීම් කමිටුව නිර්දේශ කළ කොන්ත්‍රාත්කරු වෙත ප්‍රසම්පාදනය පිරිනැමීම නිසා රජයට රු.5,492,939 ක් වැඩිපුර ගෙවීමට සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

(c) කොන්ත්‍රාත්තුවේ පිරිවිතර වලින් අයිතම 629 න් වටිනාකම රු.26,817,225 ක් වූ අයිතම 294 ක් මේ වන විටත් ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය.

(d) **මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී නිසි පරිදි අවශ්‍යතා හඳුනා නොගැනීම නිසා අභ්‍යන්තර ජාල පද්ධතිය හා දුරකථන සම්බන්ධතා වෙනුවෙන් රු.4,489,873 ක් අමතර වැය බරක් දැරීමට සිදුවී ඇති බව නිරීක්ෂණය විය.**

(vi) ගෘහභාණ්ඩ මිලදී ගැනීම හා අභ්‍යන්තර අලංකාර කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය උපදේශන සේවා ලබාගැනීමට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය පත්කර තිබුණි. ඒ සඳහා ඔවුන්ට ගිවිසුම්ගත වටිනාකමින් 8% ක් උපදේශක ගාස්තු සැපයීමට එකඟව තිබුණි. උපදේශන ගිවිසුමේ 3,4 ඡේද ප්‍රකාරව පළමු අදියරේ සිට නඩත්තු කාලසීමාව දක්වා විවිධ සේවා ලබා දීමට එකඟව සිට අධීක්ෂණ කටයුතු සිදුකිරීමට කටයුතු කළද, එම අධීක්ෂණය නිසියාකාරව සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.

3.3 පාඩු හා හානි

2022 වර්ෂය තුළදී වාහන අනතුරු 03 ක් සිදුව තිබුණ ද, මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් සටහන් තුළ එම අනතුරු පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

2.7 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් "විසුම්පාය" ගොඩනැගිල්ලේ කොටසක ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා වැඩිදියුණු කිරීමේ කටයුතු වෙනුවෙන් 2021 දෙසැම්බර් මාසයේදී රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් රු.1,373,862 ක් ලබාගෙන තිබුණ ද, 2022 ජුනි මාසයේදී කාර්යාලය එම ස්ථානයෙන් ඉවත් කර අමාත්‍යාංශ පරිශ්‍රය තුළ පිහිටුවීම නිසා දරන ලද ඉහත වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ආ) විදුලිබල අමාත්‍යාංශය සතු වාහනයක සිදුවූ කාර්මික දෝෂයක් නිසා රථය අලුත්වැඩියාව සඳහා 2022 නොවැම්බර් මස ලබාදී තිබුණු අතර, විගණිත දිනය වූ 2023 අප්‍රේල් 12 වන දින විටත් අලුත්වැඩියා කටයුතු සිදු කර නොතිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඊට ප්‍රමාණවත් මුදලක් අත්තිකාරම් ලෙස ලබාදීම කළයුතු වුවත් නිලධාරීන් 05දෙනෙකුට අවස්ථා 08කදී ලබාදුන් අත්තිකාරම් උපයෝජනය කිරීමෙන් තොරව දින කිහිපයක් අත රඳවාගෙන සම්පූර්ණයෙන්ම පියවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) එක් අග්‍රිමයක් ලබාදී එය පියවීමට ප්‍රථම නැවත අග්‍රිම ලබාදුන් අවස්ථා 09 ක් නිරීක්ෂණය විය.

(ඇ) භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස උපරිමයෙන් සුරක්ෂිත කරමින් ප්‍රශස්ත මාධ්‍යකරණයක් තහවුරු කිරීමේ අරමුණ සහිතව විද්‍යුත් මාධ්‍ය සඳහා විකාශන අධිකාරි පනත විගණිත දින දක්වාම සකස් කර නොතිබුණි. එමෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීමේ යාන්ත්‍රණය නියාමනය කිරීමේ ක්‍රමවේදයද නිමකර නොතිබුණි.

(ඈ) ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් භෞමික රූපවාහිනී, ගුවන් විදුලි, වන්දිකා (Satellite TV), Internet Protocol Television (IPTV), Cable TV සහ Mobile TV යන ආකාරයන් මඟින් විකාශනයන් සිදුකරනු ලබන ආයතන වෙත 2022 වර්ෂය තුළ නිකුත් කරන ලද බලපත්‍ර 34 ක් සඳහා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට හා වාර්ෂිකව හෝ කාලීනව බලපත්‍ර අලුත් කිරීමේ විධිමත් ක්‍රමවේදය සකස් නොකිරීම නිසා බලපත්‍ර ගාස්තු ලෙස හා බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු ලෙස ලබාගත හැකි විශාල ආදායමක් රජයට අහිමිවී තිබුණි. තවද ගුවන් විදුලි හා රූපවාහිනී විකාශන බලපත්‍රයන්හි ඒකමතිකභාවයක් ඇති කිරීමට පොදු ආකෘතියක් විගණිත දින දක්වාම හඳුන්වා දී නොතිබුණි.

(ඉ) factchecker.lk ඩොමේන් නාමය යටතේ පවත්වාගෙන යන වෙබ් අඩවිය සිංහල බසින් 2022 ජනවාරි 19 දිනද, දෙමළ හා ඉංග්‍රීසි බසින් 2021 නොවැම්බර් 10 දිනෙන්ද පසු යාවත්කාලීන කර නොතිබුණි.

4. තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

තිරසාර සංවර්ධනය අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවයන් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වීමේ අවදානම හඳුනාගෙන ඒවා අවම කිරීමට ගතයුතු පියවරයන් වශයෙන් නිසි ක්‍රම සම්පාදන සැලැස්මක් සකස් කිරීම, නිලධාරීන් දැනුවත් කිරීම හා අවශ්‍ය පිළියම් හා

තීරණ ක්‍රියාත්මක කිරීමට කමිටුවක් පත් කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. තවද තිරසර සංවර්ධන ඉලක්ක 02 ක් හඳුනාගෙන තිබූ අතර, ඉන් පළමුවැනි කොටස සියයට 20 කින්ද, 2 වන ඉලක්කය පුහුණුකරුවන් පුහුණු කිරීම සියයට 30 ක්ද තොරතුරු නිලධාරීන් පුහුණු කිරීම සියයට 6 ක්ද, වශයෙන් අඩු මට්ටමක ප්‍රගතියක් දක්වා තිබුණි .

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවක් සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත්කළ යුතු වුවද අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකවරයකු 2023 මාර්තු 31 වන විටත් පත්කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 08 ක්ද තෘතීයික මට්ටමේ පුරප්පාඩු 04 ක්ද ද්විතීය මට්ටමේ පුරප්පාඩු 07 ක්ද, ප්‍රාථමික මට්ටමේ 17 ක්ද වශයෙන් පුරප්පාඩු 36 ක් පැවතීම ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීම සඳහා සෘණාත්මකව බලපා තිබුණි.

(ආ) ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැටුප් ලබන නිලධාරීන් 03 දෙනකු තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් කොමිසමට (RTI), නිලධාරීන් 04 ක් රුහුම් පාලක මණ්ඩලයට, නිලධාරීන් 02 ක් රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් හා පළාත් පාලන අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබුණි.

විගණකාධිපති

www.media.gov.lk

ජනමාධ්‍ය අමාත්‍යාංශය
வெகுசன ஊடக அமைச்சு
Ministry of Mass Media

අංක. 163, ඇසිඩිසි මැදුර, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05
இல. 163, அசிதிசி மெதுர, கிருளப்பனை மாவத்தை, பொல்ஹேன்கொடை, கொழும்பு 05
No. 163, Asi Disi Medura, Kirulapone Mawatha, Polhengoda, Colombo 05

දුරකථන / தொலைபேசி / Telephone
011-2513 459, 011-2512 321, 011-2513 498